# දෙවැනි කොටස


| | |
|---|---|
| මහ බැංකුවේ ගිණුම් හා කටයුතු .. .. | I – XLI |
| කාර්ය මණ්ඩල පුවත් .. .. | XLII – XLIII |

# මහ බැංකුවේ ගිණුම හා කටයුතු


| | | | පිටුව |
|---|---|---|---|
| ගිණුම් සහ බැංකු කටයුතු | ... | ... | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව | ... | ... | VIII |
| බැංකු සංවර්ධන | ... | ... | IX |
| බැංකු අධීක්ෂණය | ... | ... | XI |
| මූල්‍ය සමාගම් අධීක්ෂණය | ... | ... | XII |
| සංවර්ධන මුදල් | ... | ... | XVI |
| ග්‍රාමීය ණය | ... | ... | XXIV |
| * ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | ... | ... | XXVI |
| ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය | | ... | XXVIII |
| සේවක අර්ථ සාධක අරමුදල | ... | ... | XXIX |
| විනිමය පාලන | ... | ... | XXXI |
| රාජ්‍ය ණය | ... | ... | XXXIV |
| * ප්‍රාදේශීය කාර්යාල—මාතර, අනුරාධපුරය සහ මාතලේ | | ... | XXXV |
| ප්‍රවෘත්ති හා ප්‍රකාශන | ... | ... | XXXVII |
| පර්යේෂණ කටයුතු | ... | ... | XXXVIII |
| ශ්‍රී ලංකා ස්වයංක්‍රිය නිෂ්කාශනාගාරය | ... | ... | XXXIX |
| කළමනාකාරිත්ව විගණන | ... | ... | XL |
| සමීක්ෂණ සහ දත්ත රැස් කිරීම | ... | ... | XL |
| පුහුණු කිරීම | ... | ... | XLI |
| කාර්ය මණ්ඩල පුවත් | ... | ... | XLII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1990 දෙසැම්බර් 28 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා ලාභ අලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1990 අවසානය වන විට මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 77,462 ක් විය. එය පසුගිය වසර හා සසඳන විට සියයට 23.4 ක වැඩිවීමකි. වත්කම් අංශය සළකන විට මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත සියයට 60.8 කින් ද, වෙනත් වත්කම් සියයට 34.7 කින් ද, දේශීය වත්කම් සියයට 11.2 කින් ද වැඩිවී ඇත. දේශීය වත්කම් අතර විශාලතම වැඩිවීම වූ සියයට 74.6, කෙටිකාලීන වත්කම්වලින් වාර්තා විය. මූල්‍ය ආයතන සඳහා දයකවීම් සියයට 69.4 කින් ද, මධ්‍යම හා දීර්ඝ කාලීන ණය යෝජනා ක්‍රමය යටතේ වූ ප්‍රතිමූල්‍ය ණය සියයට 61.9 කින් ද, රජයට සපයන ලද ණය සහ අත්තිකාරම් ප්‍රමාණය සියයට 49.6 කින්ද වැඩි විය. කෙසේ වුවද මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන ප්‍රමාණය පසුගිය වසර හා සසඳන විට සියයට 7.2 ක අඩුවීමක් වාර්තා විය.

වගකීම් අංශයෙන් සලකන විට කලින් වසරේ ලාභයෙන් රුපියල් දශ ලක්ෂ 500 ක් අතිරික්ත ගිණුමට මාරුකිරීම නිසා ප්‍රාග්ධන ගිණුම සියයට 467.3 ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත. මුළු වගකීම් වලින් එක් කොටසක් වශයෙන් පවත්නා විශාලම අයිතමය වන සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය පසුගිය වසරට වඩා සියයට 13.1 ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත. මහ බැංකුව සමඟ පවතින සමස්ත තැන්පතු ප්‍රමාණය සියයට 46.8 කින් වැඩිවී ඇති අතර එයට අයත්වන රජයේ තැන්පතු සියයට 30.0 කින් ද, රජයේ නියෝජිත ආයතන සතු තැන්පතු සියයට 220.8 කින්ද, වාණිජ බැංකු තැන්පතු සියයට 33.3 කින්ද, ජාත්‍යන්තර ආයතන විදේශ ආණ්ඩු සහ විදේශ බැංකු ආයතන සතු තැන්පතු සියයට 73.5 කින්ද වැඩි වී ඇත. මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල සියයට 73.3 ක වැඩිවීමක් වාර්තා කර ඇත. (මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල ප්‍රධාන අංශ පිළිබඳ සැසඳුමක් 2.2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.)

මහ බැංකුවේ 1990 වසර සඳහා වූ ආදයම රුපියල් දශ ලක්ෂ 7,727 ක් වූ අතර එය පසුගිය වසරට වඩා සියයට 11.3 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. වියදම් හා සංචිත ගිණුමට කරන ලද වෙන්කිරීම් ද, ක්ෂයවීම් හා අනෙකුත් ගෙවීම් ද වෙන්කළ විට අදල වර්ෂය සඳහා මහ බැංකුවේ ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 750 ක් විය. මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර රුපියල් දශ ලක්ෂ 250 ක් බැංකුවේ අතිරික්ත ගිණුමට මාරු කරන ලදී. රුපියල් දශ ලක්ෂ 500 ක ඉතිරි ශේෂය, මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජයට ගෙවීම සඳහා වෙන්කර ඇත.

## විදේශ විනිමය කටයුතු

වාණිජ බැංකු සමඟ කෙරෙන විනිමය ගණුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරය සඳහා වූ දෛනික එතැන් ගැනුම් හා විකුණුම් මිල තීරණය කිරීම තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යන ලදී. 1990 අගෝස්තු මස 20 දින සිට බලපවත්වන පරිදි මහ බැංකුව විසින් එ. ජ. ඩොලරය සඳහා වූ දෛනික විනිමය අනුපාත නියම කිරීමේ නව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. විනිමය ලිහිල් කිරීමේ ප්‍රතිපත්තියේ තවත් ඉදිරි පියවරක් වූ මෙම නව ක්‍රමය යටතේ මහ බැංකුව මගින් එ. ජ. ඩොලරයට දෛනික විනිමය අනුපාත තීරණය කිරීමේදී විදේශ මුදල් සඳහා දේශීය හා විදේශීය වෙළෙඳ පොළෙහි පවත්නා ඉල්ලුම් හා සැපයුම් තත්වයන්, බැංකු ක්‍රමය තුළ පවත්නා සමස්ත ද්‍රවශීලතා තත්ත්වය, විදේශ විනිමය අන්තර් අනුපාතිකයන්ගේ වෙනස්වීම සහ අනෙක් අදාළ සාධක ද සැළකිල්ලට ගනු ඇත. එ. ජ. ඩොලරය සඳහා වූ එතැන් ගැනුම් හා විකුණුම් මිළ අතර විස්තාරය එ. ජ. ඩොලර් සියයකට රුපියල් තුනක් විය.

**ශ්‍රී ලංකා**

**1990 දෙසැම්බර් 28 වැනි**

## වගකීම්

| 1989 දෙසැම්බර් මස 29 වැනි දින රුපියල් | | | 1990 දෙසැම්බර් මස 28 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 9,20,00,000 | 10,70,00,000 | අතිරික්තය .. | 59,20,00,000 | 60,70,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 2,020,74,21,450 | | නෝට්ටු .. | 2,286,90,22,916 | |
| 91,85,66,342 | 2,112,59,87,792 | කාසි .. | 103,15,10,896 | 2,390,05,33,812 |
| | | **තැන්පතු** | | |
| 276,47,09,352 | | රජය .. | 359,33,01,872 | |
| 6,88,34,706 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 22,07,49,507 | |
| 559,66,34,032 | | වෙළෙඳ බැංකු .. | 745,75,46,661 | |
| 546,37,06,571 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 948,13,96,781 | |
| 1,74,878 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 1,67,87,750/- හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 1,33,632 | |
| 69,50,77,765 | 1,458,91,37,304 | අනෙකුත් .. | 67,02,47,118 | 2,142,33,75,571 |
| | 263,19,58,214 | විදේශීය ණය ගැනීම් .. | | 9,99,397 |
| | 187,50,00,000 | මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල .. | | 325,00,00,000 |
| | 22,00,00,000 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම .. | | 37,27,50,000 |
| | 2,222,14,01,356 | අනෙකුත් වගකීම් හා ගිණුම් .. | | 2,790,72,82,093 |
| | 6,277,04,84,666 | | | 7,746,19,40,873 |

**1990 දෙසැම්බර් මස 28 වැනි දිනෙන්**

| 1989 දෙසැම්බර් මස 29 වැනි දින රුපියල් | | | 1990 දෙසැම්බර් මස 28 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 593,93,97,126 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම් | | 697,66,53,959 |
| | | 1990 දෙසැම්බර් 28 වැනිදයින් අවසන් වූ වර්ෂයේ ශුද්ධ ලාභය | | |
| 5,05,371 | | මූල්‍ය ගැලපීම් ගිණුමට මුදල් නීති පනතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට | | |
| 50,00,00,000 | | මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොදා ගන්නා ලදී. | 25,00,00,000 | |
| 50,00,00,000 | 100,05,05,371 | මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට | 50,00,00,000 | 75,00,00,000 |
| | 693,99,02,497 | | | 772,66,53,959 |

**එච්. එන්. එස්. කරුණාතිලක**
අධිපති

**එම්. බී. දිසානායක**
ප්‍රධාන ගණකාධිකාරී

# මහ බැංකුව

## දිනට ශේෂ පත්‍රය

### වත්කම්

| 1989 දෙසැම්බර් මස 29 වැනි දින රුපියල් | | | 1990 දෙසැම්බර් මස 28 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 482,83,92,377 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 846,07,10,058 | |
| 467,80,05,347 | | *විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | 753,36,10,210 | |
| 45,21,56,659 | 995,85,54,383 | විශේෂ ආපසු ගැනීම් හිමිකම්පත් | 1,63,37,923 | 1,601,06,58,191 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 759,95,51,611 | | රජයට .. | 1,116,16,96,884 | |
| | | අනෙකුත් අයට–මධ්‍යම හා | | |
| 157,21,45,018 | | දීර්ඝ කාලීන .. | 254,52,58,079 | |
| 274,03,95,432 | | කෙටි කාලීන .. | 478,50,05,960 | |
| ,914,13,86,521 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 2,704,43,07,233 | |
| 22,00,00,000 | 4,127,34,78,582 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දයක දීමනා .. | 37,27,50,000 | 4,590,90,18,156 |
| | 1,153,84,51,701 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 1,554,22,64,526 |
| | 6,277,04,84,666 | | | 7,746,19,40,873 |

*1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55,27,675/– ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450/– ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697/– ක් සහ රු. 34,340/– ක් විය.)

## අවසන්වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1989 දෙසැම්බර් මස 29 වැනි දින රුපියල් | | 1990 දෙසැම්බර් මස 28 වැනි දින රුපියල් |
|---|---|---|
| 693,99,02,497 | පොළී ආදිය .. | 772,66,53,959 |
| 693,99,02,497 | | 772,66,53,959 |

1990 දෙසැම්බර් 28 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පණතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ (422 පරිච්ඡේදය) 42(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංග්‍රහයේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් නීති පනතේ (422 පරිච්ඡේදය) 42(2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමති තුමා වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේ දී ඉදිරිපත් කෙරෙනු ඇත.

1991 අප්‍රේල් මස 15 වැනි දින,
කොළඹ 7.
විගණකාධිපති දෙපාර්තමේන්තුවේදිය.

ඩබ්ලිව්. ගාමිණී ඇතා
විගණකාධිපති

## 2 . 2 සංඛ්‍යා සටහන

### 1989 හා 1990 මුදල් වර්ෂයන්ගේ අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් සහ වගකීම්වල වූ ප්‍රධාන අයිතමයන්ගේ සැසඳීම

| අයිතමය | වගකීම් 1989 රුපියල් දශ ලක්ෂ | වගකීම් 1989 % | වගකීම් 1990 රුපියල් දශ ලක්ෂ | වගකීම් 1990 % |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම .. | 107·0 | 0·2 | 607·0 | 0·8 |
| සංසරණයේ පවත්නා ව්‍යවහාර මුදල් .. | 21,126·0 | 33·7 | 23,900·5 | 30·9 |
| තැන්පතු .. | 14,589·1 | 23·2 | 21,423·3 | 27·6 |
| විදේශීය ණය ගැනීම් .. | 2,632·0 | 4·2 | 1·0 | — |
| මධ්‍ය හා දිගුකාලීන ණය .. | 1,875·0 | 3·0 | 3,250·0 | 4·2 |
| ප්‍රාග්ධන දයක දීමනා ගිණුම .. | 220·0 | 0·3 | 372·8 | 0·5 |
| අනෙකුත් වගකීම් .. | 22,221·4 | 35·4 | 27,907·3 | 36·0 |
| එකතුව .. | 62,770·5 | 100·0 | 77,461·9 | 100·0 |

| අයිතමය | වත්කම් 1989 රුපියල් දශ ලක්ෂ | වත්කම් 1989 % | වත්කම් 1990 රුපියල් දශ ලක්ෂ | වත්කම් 1990 % |
|---|---|---|---|---|
| ජාත්‍යන්තර සංචිතය | 9,958·6 | 15·9 | 16,010·6 | 20·7 |
| දේශීය වත්කම් .. | 41,273·5 | 65·7 | 45,909·0 | 59·2 |
| අනෙකුත් වත්කම් .. | 11,538·4 | 18·4 | 15,542·3 | 20·1 |
| එකතුව .. | 62,770·5 | 100·0 | 77,461·9 | 100·0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

අවශ්‍ය අවස්ථාවලදී ඉදිරි විනිමය අනුපාතිකයේ ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා එ. ජ. ඩොලර් අලෙවි කරමින් ඉදිරි වෙළෙඳපොල කටයුතු සඳහා මහ බැංකුව මැදිහත් විය. වාණිජ බැංකුවලින් විදේශ විනිමය ඉදිරි මිළදී ගැනීමට මහ බැංකුව නිතිපතා සහභාගී විය. මෙවැනි ආවරණයක් සඳහා වූ කාලසීමාව මාස හයක් විය.

මහ බැංකුව පෙර පරිදිම එහි විදේශ විනිමය සංචිත ජාත්‍යන්තර මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොලෙහි ආයෝජනය කරන ලදී.

**කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි රත්‍රං අලෙවිය**

අදල වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුව කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි රත්‍රං විකුණුම් සාප්පු දෙකක් ආරම්භ කලේය. පළමුවැන්න 1990 ජූනි මස රටින් පිටත්වන/භුවමාරු වන මගීන් සඳහා වූ කොටසෙහි ආරම්භ කෙරිණි. මෙම සාප්පුවෙන් මිළදී ගත් රත්‍රං ශ්‍රී ලංකාවට ආපසු ගෙන ඒමට නොහැකි විය. දෙවැන්න, රටට පැමිණෙන මගීන් සඳහා වූ කොටසේ 1990 සැප්තැම්බර් මසයේදී පිහිටුවන ලදී. එක් පුද්ගලයකුට වසරකට තීරුබදු වලින් නිදහස්ව එ. ජ. ඩොලර් 1,000ක් වටිනා රත්‍රං මෙම සාප්පුවෙන් මිළදී ගැනීම සඳහා ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර හිමියන් හිමිකම් ලබයි. මෙම සාප්පුවලින් මිළදී ගැනීම් මහ බැංකුව විසින් නියම කරන ලද පරිවර්ත්‍ය මුදල්වලින් පමණක් සිදු කළ යුතු විය.

**ආසියානු නිෂ්කාශණ සංගමය**

ආසියානු නිෂ්කාශණ සංගමය (ආ. නි. සං.) මගින් සිදු කෙරුණු මුළු ගණුදෙනු ප්‍රමාණය පසුගිය වසර තුල වූ රුපියල් දශ ලක්ෂ 16,209 හා සසඳන විට 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 11,442 ක් විය.

1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 393 හා සසඳන විට 1990 දී විදේශ මුදල් වලින් සිදු කෙරුණු ශුද්ධ පියවීම්වල රුපියල් වටිනාකම රුපියල් දශ ලක්ෂ 4,401 ක් විය. 1988 වසරේ හඳුන්වා දෙන ලද සාමාජිකයින් අතර හුවමාරු පහසුකම මේ වසර තුළද තවදුරටත් ක්‍රියාත්මක විය. මහ බැංකුව මෙම පහසුකම යටතේ රුපියල් දශ ලක්ෂ 754 ක් ලබාගෙන ඇත.

**මහ බැංකු පොළී අනුපාතය**

රජයේ සුරැකුම්පත් ඇපකර මත සහ වාණිජ හා නිෂ්පාදන ණය සම්බන්ධ භාවිතිය පොරොන්දු නෝට්ටු ඇපකර මත වාණිජ බැංකු සඳහා සපයන කෙටිකාලින ණය අත්තිකාරම් සඳහා වූ මහ බැංකු පොළී අනුපාතය 1990 ජුලි මස 6 දින සිට සියයට 14 සිට සියයට 15 දක්වා වැඩි කරන ලදී.

**කෙටි කාලින ණය**

අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුව මගින් වාණිජ බැංකු සඳහා ණය පහසුකම් සැපයීම වසර පුරාම ක්‍රියාත්මකව පැවතිණි. කාණ්ඩ 1 (පාරම්පරික) සහ කාණ්ඩ 11 (පාරම්පරික නොවන) යන අංශ දෙක සඳහා ම අදල වූ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමේ කාලසීමාව දින 90 වශයෙන් එලෙසම පැවතිණි. කෙසේ වෙතත්, එක් එක් ඉල්ලීම වෙන වෙනම සලකා බැලීමේ පදනම මත මුළු කාලසීමාව දින 120 දක්වා තවදුරටත් දින 30 ක කාලසීමාවකින් දීර්ඝ කිරීම් සලසන ලදී. කාණ්ඩ 1 යටතේ අපනයන ණය සඳහා ප්‍රතිමූල්‍ය සම්බන්ධ පොළී අනුපාතය වසරකට සියයට 11 වශයෙන්ද, බැංකු වලින් ණය සපයන අනුපාතය වසරකට සියයට 14 වශයෙන්ද, කාණ්ඩ 11 යටතේ අදල අනුපාතයන් පිළිවෙලින් වසරකට සියයට 6.0 හා 9.8 වශයෙන් ද තවදුරටත් පැවතිණි. මහ බැංකුව විසින් අපනයන ණය ප්‍රතිමූල්‍ය මත අය කරන ලද පොළියෙන් ප්‍රතිශත අංක 4 ක් ආපසු ගෙවීම තවදුරටත් කරගෙන ගිය අතර එම නිසා

විනිමය පාලක විසින් නිශ්චය කරන ලද කාලසීමාව තුළ අපනයන ඉපැයීම් ලංකාවට ලැබුණු බව සනාථ කරන අපනයන කරුවන් වෙත මෙම ප්‍රතිලාභය ගෙවීමට අදාළ වාණිජ බැංකුවට හැකියාව ලැබිණි. රජය වෙනුවෙන් සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව මගින් පවත්වාගෙන යන ස්වාරක්ෂක තොග සඳහා සහල් හා තිරිඟු/තිරිඟු පිටි ආනයනය වෙනුවෙන් දින 180 ක කාලපරිච්ඡේදයක් සඳහා සියයට 15 ක වාර්ෂික පොළිය යටතේ රුපියල් දශ ලක්ෂ 1,500 ක විශේෂ ප්‍රතිමූල්‍ය පහසුකම් සලසන ලදී.

1990 අප්‍රේල් මස 1 දින සිට වී, එළවළු සහ වෙනත් විශේෂිත භෝග සම්බන්ධ සමුපකාර සමිතිවල හෝ පුද්ගලයන්ගේ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වූ මහ බැංකු ණය අත්තිකාරම් සඳහා පැවතුණු වාර්ෂික පොළී අනුපාතය වසරකට සියයට 1.5 සිට සියයට 4.5 දක්වා වැඩි කරන ලදී. මෙම අත්තිකාරම් ග්‍රාමීය සුපිරි ණය ක්‍රමය යටතේ සපයන ලදී. වී මිළදී ගැනීම සඳහා සහ වෙනත් දේශීය වශයෙන් වගාවන භෝග මිළදී ගැනීම හා ගබඩා කිරීම සඳහා සමුපකාර සංගම්, කෘෂි සේවා මධ්‍යස්ථාන සහ බලයලත් පුද්ගලයන්ට ණය සැපයීම සඳහා භාවිතීය පොරොන්දු නෝට්ටු මත වාණිජ බැංකුවලට සපයන ලද අත්තිකාරම් සඳහා වූ වාර්ෂික පොළිය සියයට 3 වශයෙන් නොවෙනස්ව පැවතිණි.

**මධ්‍ය හා දිර්ඝ කාලීන ණය අරමුදල**

1989 වසරේ අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 1,875 ක් ව පැවති මධ්‍ය හා දීර්ඝ කාලීන ණය අරමුදල 1990 වසර අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 3,250 ක් දක්වා වැඩි විය. අදාල වගකීම් භාරයන් සැළකිය යුතු අයුරින් වැඩිවීම නිසා රුපියල් දශ ලක්ෂ 1,375 ක පමණ මුදලක් මහ බැංකුවේ පොදු සංචිත ගිණුමෙන් මෙම අරමුදලට මාරු කරන ලදී.

1990 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මධ්‍ය හා දීර්ඝ කාලීන ණය අරමුදලේ කාණ්ඩ 1 යටතේ සපයන ලද ණය සඳහා වූ වාර්ෂික පොළී අනුපාතය සියයට 12.5 සිට සියයට 14 දක්වා වෙනස් කරන ලදී. මහ බැංකු ප්‍රතිමූල්‍ය වාර්ෂික පොළී අනුපාතය සියයට 7 ක් වශයෙන් ස්ථාවරව පැවති අතර එමගින් ණය දෙන ආයතනවලට සියයට 7 ක අමතර අනුපාතයක් පවත්වා ගැනීමට ඉඩ සැලසුණි. කාණ්ඩ II යටතේ අදාල ණය දෙන ආයතන සඳහා වූ මෙම අමතර අනුපාතය ප්‍රතිශත අංක 2 කින් සියයට 4 දක්වා වැඩි කරන ලද අතර ණය සැපයීම මත වූ වාර්ෂික පොළී අනුපාතය එලෙසම පවත්වාගෙන යාමේ පරමාර්ථයෙන් ඒ හා සම්බන්ධ මහ බැංකු ප්‍රතිමූල්‍ය වාර්ෂික පොළී අනුපාතය ඒ හා සමානව ප්‍රතිශත අංක 2 කින් අඩු කරන ලදී. කාණ්ඩ III හා IV සඳහා වූ පොළී අනුපාතයන් නොවෙනස්ව පැවතිණි.

**මූල්‍ය සමාගම් සඳහා පහසුකම්**

1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතේ 20 (4) (අ) වගන්තිය සහ 21(1) වගන්තිය ප්‍රකාර තාවකාලික ද්‍රවශීලතා ප්‍රශ්න පවතින සහ/හෝ කළමනාකාරිත්වය හා පරිපාලනය මුදල් මණ්ඩලය වෙත පවරාගත් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා ණය පහසුකම් සැළසීම සඳහා කෙරෙන ණය සැපයීම වෙනුවෙන් වාණිජ බැංකුවලට පහසුකම් සැළසීම මහ බැංකුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. 1990 අවසාන වන විට මේ යටතේ රුපියල් දශ ලක්ෂ 684 ක් නිකුත් කර තිබිණි.

**සංචිත අවශ්‍යතාවයන්**

ඉල්ලුම්, කාලීන සහ ඉතුරුම් තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 15 වශයෙන් පැවති අතර සංචිත අවශ්‍යතා සඳහා පවත්වාගත හැකි භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයද ප්‍රතිශත අංක 5 වශයෙන් පසුගිය වසර තුල නොවෙනස්ව පැවතිණි.

## වාණිජ බැංකු ණය

### (අ) ණය සීමාව

පසුගිය වසරේ මහ බැංකුව මගින් වාණිජ බැංකු වෙත පනවන ලද 1989 ජුනි මස 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෞද්ගලික අංශයට දෙන ලද නොපියවා ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණය 1989 මැයි 31 දින වන විට පැවතුණු නොපියවන ලද අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවිය යුතුය යන ණය සීමා කොන්දේසිය 1990 වසර තුල ද එලෙසම පැවතිණි.

### (ආ) ණයවර ලිපි සඳහා තැන්පතු අවශ්‍යතාවයන්

1988 ජුනි මස 15 දින සිට අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ කොටසට ගැනෙන ආනයන සඳහා නිකුත් කළ ණයවර ලිපි සඳහා තම ගණුදෙනු කරුවන්ගෙන් සියයට සියයක මුදල් තැන්පතු ලබාගන්නා ලෙස වාණිජ බැංකු වෙත පනවන ලද නියෝගය එලෙසම පවත්වාගෙන යන ලදී.

1990 මාර්තු මස 30 දින සිට බලපවත්වන පරිදි උපාංග වශයෙන් වෙන් කරන ලද පදනම යටතට ගැනෙන භාණ්ඩ වුවද අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ කොටසට ගැනෙන අවස්ථා වලදී එම ණයවර ලිපි ද සියයට සියයක මුදල් තැන්පතු සීමාවට යටත් විය. 1990 ජුලි 30 දින සිට කටුනායක අන්තර් ජාතික ගුවන් තොටුපලේ තීරුබදු වලින් නිදහස් සාප්පු සංකීර්ණයේ විකිණීම සඳහා ආනයනය කරන භාණ්ඩ මෙම සියයට සියයක් වූ මුදල් තැන්පතු සීමාවෙන් නිදහස් කරන ලදී.

## භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීය වෙළෙඳ පොල

භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීය වෙළෙඳපොලේ විකුණුම් පිරිවැටුම 1989 වසර සඳහා රුපියල් දශ ලක්ෂ 72,810 ක් වුවද, 1990 වසරේදී එය රුපියල් දශ ලක්ෂ 67,907 දක්වා අඩු වී ඇත. වර්ෂය තුල මිළදී ගැනුම් පිරිවැටුමද රුපියල් දශ ලක්ෂ 21,428 සිට රුපියල් දශ ලක්ෂ 21,355 දක්වා සුළු වශයෙන් අඩු වී ඇත. බැංකු නොවන අංශයට අදල ශුද්ධ විකුණුම් පිරිවැටුම 1989 වසර සඳහා වූ රුපියල් දශ ලක්ෂ 15,399 සිට 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 8,132 දක්වා අඩු වී ඇත.

අදල වර්ෂය තුළ භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීය වෙළෙඳපොළේ කටයුතු සඳහා බලපාන ලද වට්ටම් අනුපාතය සියයට 13.25 සිට සියයට 20.5 දක්වා වෙනස් විය.

## මෙරට හැරයන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර හා කරුණාසහගත ගෙවීම

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධ යෝජනා ක්‍රමය රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් පවත්වා ගෙන යන ලදී.

## අපනයන කරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන

අපනයන කරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන සඳහා වාණිජ බැංකු මගින් ඉදිරිපත් කරන ලද හිමිකම් ප්‍රතිපූරණය කිරීම රජය වෙනුවෙන් මහ බැංකුව මගින් තවදුරටත් පවත්වාගෙන යන ලදී. ඒ යටතේ 1990 වසර තුල රුපියල් දශ ලක්ෂ 668.4 ක් ප්‍රතිපූරණය කරන ලදී.

## අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීම් පනතේ සහ 1972 අංක 15 දරන ආදයම් උපරිම සහ අනිවාර්ය ඉතිරි කිරීම් පනතේ වගන්ති අනුව එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් රජය වෙනුවෙන් මහ බැංකුව තවදුරටත් කටයුතු කරන ලදී. අදල වර්ෂය තුල අයදුම්පත් 54 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 0.2 ක් (පොළිය ද ඇතුලත්ව) දයකයන් වෙත ගෙවන ලදී.

**රජයේ ගිණුම්**

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුව විසින් රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිත ආයතන හා ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන යාම තවදුරටත් කරගෙන යන ලදී. 1990 වසර අග වන විට ක්‍රියාත්මක ගිණුම් සංඛ්‍යාව 189 ක් විය.

## ව්‍යවහාර මුදල් නිකුතුව

ව්‍යවහාර මුදල් සඳහා මහජනයාගේ ඉල්ලුම සපුරාලීම වස් 1990 වර්ෂයේදී ද සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය තවදුරටත් වැඩි විය. 1990 වසර අගදී සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 23,900 ක් වූ අතර එය ඉකුත් වසරේ පැවති ප්‍රමාණයට වඩා සියයට 13.1 ක වැඩිවීමකි.

1990 වර්ෂයේදී සංසරණයේ පැවති මුදල් නෝට්ටුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 22,868 දක්වා ඉහළ නැගි අතර, එය ගත වූ වර්ෂයේ සංසරණයේ පැවති ප්‍රමාණයට වඩා සියයට 13.2 ක වැඩිවීමකි. 1990 වසර අගදී සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් ප්‍රමාණයෙන් සියයට 95.6 ක් සැදුම් ලද්දේ මුදල් නෝට්ටු වලිනි. වටිනාකම අනුව බලන කල සංසරණයේ පැවති මුළු නෝට්ටුවල වටිනාකමින් සියයට 52.1 ක් රු. 1000 නෝට්ටුවලින් යුක්ත වූ අතර ශේෂය පිළිවෙලින් රු. 500 (23.0%), රු. 100 (16.9%), රු. 50 (3.8%), රු. 10 (2.4%) සහ රු. 20 (1.4%) වශයෙන් විය. පරිමාව අනුව බලන කල සංසරණයේ වැඩියෙන්ම පැවතියේ රු. 10 නෝට්ටුය. අනතුරුව පිළිවෙලින් රු. 100, රු. 50, රු. 20, රු. 1000 සහ රු. 500 වශයෙන් විය. රු. 1, 2 සහ 5 වටිනාකම් සහිත නෝට්ටු බැංකුව විසින් තවදුරටත් ක්‍රමයෙන් සංසරණයෙන් ඉවත් කරගනු ලැබීය.

1990 වසරේදී අබලන් නෝට්ටු දශ ලක්ෂ 108 ක් සංසරණයෙන් ඉවත් කරගන්නා ලදී. රුපියල් දශ ලක්ෂ 9,112 ක මුහුණත වටිනාකමින් යුක්ත වූ මෙම නෝට්ටු අවලංගු කොට විනාශ කරන ලදී.

1990 වසර අගදී සංසරණයෙහි පැවති කාසිවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,031 ක්වූ අතර එය කලින් වසරේ පැවති ප්‍රමාණයට වඩා සියයට 12.3 ක වැඩිවීමක් පෙන්විය. (එයට රුපියල් දශ ලක්ෂ 134 ක වටිනාකමින් යුතු සමරු කාසි ද ඇතුළත්ය.)

වටිනාකම අනුව සංසරණයේ පැවති මුළු කාසිවල වටිනාකම, සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල්වල වටිනාකමෙන් සියයට 4.4 කි. 1990 දෙසැම්බර් මස 31 දිනට සංසරණයේ පැවති කාසි අතරින් වටිනාකමෙන් වැඩිම කොටස රු. 5 කාසිය නියෝජනය කළ අතර, ඉතිරිය පිළිවෙලින් රු. 1, රු. 2, ශත 50, ශත 25, ශත 10, ශත 05, රු. 10, ශත 02 සහ ශත 01 වටිනාකමින් යුත් කාසිවලින් නියෝජනය විය.

පරිමාව අනුව බලන කල වැඩි වශයෙන්ම සංසරණය වූයේ ශත 05 කාසිය ය. අනතුරුව පිළිවෙලින් ශත 10, ශත 01, ශත 02, ශත 25, ශත 50, රු. 1, රු. 2, රු. 5, රු. 10, සහ රු. 500 වශයෙන් වේ.

1990 අගෝස්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව සිය 40 වැනි සංවත්සරය පවත්වන ලද අතර, මේ අවස්ථාව නිමිත්තෙන් රු. 500 වටිනාකමින් යුත් රිදී සමරු කාසියක් එදින නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාදේශීය ව්‍යවහාර මුදල් සේවා කටයුතු ව්‍යාප්ත කරමින් අනුරාධපුර සහ මාතර ප්‍රාදේශීය කාර්යාලයන්හි මුදල් මෙහෙයුම් කටයුතු පිළිවෙලින් 1990 ජූනි මස පළමුවැනි දින හා 1990 ජූලි මස පළමුවැනි දින ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ සහයෝගීතාව ඇතිව බියගම පිහිටුවන ලද ආරක්ෂිත මුද්‍රණ කටයුතු පිළිබඳ ඒකාබද්ධ ව්‍යාපාරය වන බ්‍රැඩ්බරි විල්කින්සන් ලංකා (පෞද්ගලික) සමාගම විසින් 1990 වසරේ මුද්‍රිත මුදල් නෝට්ටු අවශ්‍යතා සම්පූර්ණයෙන්ම සපයනු ලැබීය. සීය මව් සමාගමේ අයිතිය වෙනස්වීම හේතුවෙන්, 1990 දෙසැම්බර් 10 දින සිට මෙම සමාගම තෝමස් ඩිලාරූ ලංකා (පෞද්ගලික) සමාගම යනුවෙන් නම වෙනස් කරන ලදුව මින්මතු එනමින් හඳුන්වනු ලැබේ.

## බැංකු සංවර්ධනය

1990 දෙසැම්බර් මස අවසානය වන විට රට තුළ ක්‍රියාත්මකව පැවති වාණිජ බැංකු සංඛ්‍යාව 24 ක් ලෙසින් නොවෙනස්ව පැවැති අතර එය දේශීය වාණිජ බැංකු 6 කින් හා විදේශීය වාණිජ බැංකු 18 කින් සමන්විත විය. දේශීය වාණිජ බැංකු, රාජ්‍ය වාණිජ බැංකු 2 කින් හා පෞද්ගලික වාණිජ බැංකු 4 කින් සමන්විත විය.

බැංකු සේවාවන් ව්‍යාප්ත කිරීමේදී, නව බැංකු ශාඛා 30 ක් 1990 වර්ෂය තුළදී විවෘත කරන ලදුව, ඒ අනුව වර්ෂය අවසානයේදී පැවති මුළු බැංකු ශාඛා ගණන 740 ක් විය. රාජ්‍ය බැංකු දෙක අතරින් ලංකා බැංකුව 1990 වර්ෂයේදී ශාඛා පද්ධතිය ව්‍යාප්ත කිරීමෙලා ප්‍රමුඛ විය. ලංකා බැංකුව විසින් නව බැංකු ශාඛා 5 ක් පිළියන්දල, හංවැල්ල, දිගන, ඉමදූව හා දික්වැල්ල යන ස්ථානයන්හි විවෘත කළ අතර, ගලහ, කුරුවිට, අයගම හා මතුරට ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි පවත්වාගෙන ගිය ශාඛා, 'සී' ශ්‍රේණියේ තත්ත්වයට අධිශ්‍රේණිගත කරන ලදී. මතුරට ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛාව අධිශ්‍රේණිගත කිරීමෙන් පසු 'පදියපැලැල්ල' ශාඛාව ලෙස නම් කරන ලදී. 1990 වසර තුළදී කිඹිස්ස හා විල්ගමුව යන ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා දෙක පිළිවෙලින් දඹුල්ල හා හසලක ශාඛා දෙක සමඟ ඒකාබද්ධ කරනු ලැබූ අතර, මාන්කුලම හා කින්නියා යන ප්‍රධාන ශාඛා දෙක ද කොබෙයිගනේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛාවද නැවත විවෘත කරන ලදී. තවද වලස්ගල බැංකු ශාඛාව සහ පඹහින්න හා කෝදුගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛාවන් 1990 වසර තුළදී වසා දමන ලදී. මෙවායෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1990 වර්ෂය අවසානයේදී, ලංකා බැංකුවෙහි ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 247 ක් වූ අතර, ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා සංඛ්‍යාව 38 ක් විය. ලංකා බැංකුවේ විදේශයන්හි පිහිටි ශාඛා සංඛ්‍යාව 2 ක් ලෙසින් නොවෙනස්ව පැවැතිණි.

මහජන බැංකුව විසින්, 1990 මාර්තු හා අප්‍රේල් මාසයන්හි දී බැංකු ශාඛා 2 ක් පිළිවෙලින් මාරවල හා පානදුර ප්‍රදේශවල විවෘත කරන ලදී. 1990 නොවැම්බර් මසදී ආයතනික ශාඛාවක්ද ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙහි විවෘත කරන ලදී. මේ අතර, කින්නියා සහ මහඔය ශාඛා ද වසර තුළදී නැවත විවෘත කරන ලදී. මෙම වෙනස්වීම්හි ප්‍රතිඵලයක් වශයෙන් 1990 වසර අවසානයේදී මහජන බැංකුවේ ක්‍රියාත්මකව පැවති මුළු ශාඛා සංඛ්‍යාව 306 ක් දක්වා වැඩි විය.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින්, 1990 වසර තුළදී, බැංකු ශාඛා 3 ක් පිළියන්දල, හලාවත හා බම්බලපිටිය යන ස්ථානයන්හි විවෘත කරන ලදී. මීට අමතරව කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පූර්ව-රේගු ප්‍රදේශය තුළ බැංකු කවුන්ටරයක් විවෘත කෙරිණ, මෙනිසා එහි මුළු බැංකු ශාඛා ප්‍රමාණය 39 ක් විය. සීමාසහිත ලංකා වාණිජ බැංකුව විසින් ද තම මුළු ශාඛා සංඛ්‍යාව 19 දක්වා වැඩිකරමින්, නව ශාඛා 3 ක් බොරැල්ල, කෑගල්ල හා නුගේගොඩ යන ස්ථානයන්හි පිහිටුවනු ලැබිය. නව ශාඛා දෙකක් වත්තල හා මාතර විවෘත කිරීමත් සමඟ සම්පත් බැංකුවේ ශාඛා පද්ධතිය 13 දක්වා වැඩිවිය. මීට අමතරව සම්පත් බැංකුව විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් කොල්ලුපිටියේ ප්ලාසාහි පිහිටුවන ලදී. මේ අතර, සීමාසහිත සෙලාන් බැංකුව විසින් 1990 වර්ෂය තුළදී නව ශාඛා 11 ක් ගාල්ල, රත්නපුර කොල්ලුපිටිය, කෑගල්ල, මොරටුව, නුගේගොඩ, මීගමුව, ගම්පහ, දෙහිවල, හලාවත හා මහනුවර යන ස්ථානයන්හි විවෘත කරමින් එහි මුළු ශාඛා ප්‍රමාණය 17 දක්වා ඉහළ නංවන ලදී.

විදේශීය බැංකු අතරින් හබීබ් බැංකුව හා ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව පිළිවෙලින් නවම් මාවත හා බම්බලපිටිය යන ස්ථානවල නව ශාඛාව බැගින් විවෘත කරන ලදී. මෙම බැංකු ශාඛා දෙකත් සමඟ 1990 වර්ෂය අවසානයේදී පැවැති මුළු විදේශීය වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව 23 ක් විය.

1990 ඔක්තෝබර් මස බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් විවෘත කළ අතර, වසර අවසානය වන විට එම බැංකුව විසින් ශාඛා 4 ක් බදුල්ල, වැලිමඩ, දියතලාව හා පස්සර යන ස්ථානයන්හි විවෘත කරනු ලැබීය. කුරුණෑගල, හම්බන්තොට, මහනුවර හා මොනරාගල යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් 1990 වර්ෂය තුළදී, ශාඛා එක බැගින් අදාළ දිස්ත්‍රික්කයන්හි විවෘත කරමින් තම ශාඛා පද්ධතිය වර්ධනය කරගන්නා ලදී. පුත්තලම හා නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් නව ශාඛා දෙක බැගින් විවෘත කරන ලදී. කෑගල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව, පතාවල ශාඛාව, රුවන්වැල්ල ශාඛාව සමඟ ඒකාබද්ධ කිරීම හේතුවෙන් එහි ශාඛා සංඛ්‍යාව 10 දක්වා අඩු විය. මේවායේ ප්‍රතිඵලයක් ලෙස 1990 වසර අවසාන වන විට ක්‍රියාත්මකව පැවති ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ශාඛා සංඛ්‍යාව 100 දක්වා ඉහළ නැගිණි. ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් නව ශාඛා 7 ක් විවෘත කරන ලදුව, 1990 අවසානයේදී එහි මුළු ශාඛා ගණන 76 දක්වා වැඩිවිය.

නවීන සහ තාක්ෂණික වශයෙන් දියුණු බැංකු ශිල්පී ක්‍රම සහ උපකරණ උපයෝගී කරගනිමින්, බැංකු ක්ෂේත්‍රයේ නවීකරණයන් සහ වැඩිදියුණු කිරීම වේගවත් කිරීමේ හේතුවෙන්, 1990 වර්ෂයේදී ද බැංකු සේවාවන් තවදුරටත් වර්ධනය විය. තවද, පෞද්ගලික අංශයේ බැංකුවක් වන ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින්ද ජංගම හා ඉතුරුම් ගිණුම් ගනුදෙනුකරුවන් සඳහා ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයක් හඳුන්වා දෙනු ලැබිණි. ඉතුරුම් ගිණුම්වල මුදල් ආපසු ගැනීම ක්‍රමවත් කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ තීරණයක් මත ඉතුරුම් ගිණුම් සඳහා තිබූ චෙක්පත් ලිවීමේ පහසුකම 1990 අප්‍රේල් මස 23 දින සිට ඉවත් කරන ලදී. රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන්ට ප්‍රතිචාර වශයෙන් වාණිජ බැංකු විසින් ස්වයං රැකියාවන්හි නිරත සුළු පරිමාණ ව්‍යවසායකයන් හා රැකියා විරහිත තරුණයින් සඳහා අරමුදල් සැපයීම පිණිස විශේෂ ණය යෝජනාක්‍රම දියත් කිරීම තවදුරටත් කරගෙන ගිය අතර ඇප සහ සුරැකුම් නොතකමින් ව්‍යාපෘතියේ සාර්ථකත්වය පදනම් කරගෙන ණය මුදල් සැපයීම මෙම ණය ක්‍රමයන්ගෙන් අවධාරණය කෙරිණ.

**සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය**

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය (CIDA) යන ආයතන දෙකෙහි මූල්‍යමය සහයෝගය ඇතිව සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා සැළසුම් කර ඇති ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජනායතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි. පුත්තලම, මහනුවර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි දිළිඳු පවුල් 32,870 කගේ පමණ දරිද්‍රතාවය ලිහිල් කිරීම සහ එම දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ආධාර කිරීම මෙම ව්‍යාපෘතියෙන් මූලිකව අදහස් කෙරේ. ග්‍රාමීය දිළිඳු ජනතාවගේ කෙටිකාලීන හා මධ්‍යකාලීන ණය අවශ්‍යතා සැපයීම වස් සුරැකුම් රහිතව හෝ ඉතා අඩු සුරැකුම් සහිතව ආයතනික ණය පහසුකම් වැඩි වශයෙන් සැලසීම සඳහා සුදුසු අඩු පිරිවැය ක්‍රමයක් සකස් කිරීමත්, ගැමි ආර්ථිකය පදනම් කරගත් ආදායම් උපදවන කාර්යයන්හි කාන්තා සහභාගිත්වය දිරිමත් කිරීමත්, ප්‍රාදේශීය මට්ටමින් නැවත ආයෝජනය කිරීම සඳහා ගැමි අංශයේ ඉතුරුම් වැඩි වශයෙන් රාශීකරණය කිරීමත් මෙම ව්‍යාපෘතියෙහි අපේක්ෂිත අරමුණු වේ.

මෙම ව්‍යාපෘතිය 1989 දී දියත් කරනු ලැබූවත්, රට තුළ පැවති නොසන්සුන් තත්ත්වය නිසා ව්‍යාපෘතියට අදළ දිස්ත්‍රික් කාර්යාල විවෘත කිරීම ප්‍රමාද විය. ඒ අනුව පුත්තලම සහ මහනුවර ව්‍යාපෘති දිස්ත්‍රික්ක කාර්යාල 1990 මැයි මාසයේදී ද, ගාල්ල සහ මාතර ව්‍යාපෘති දිස්ත්‍රික් කාර්යාල 1990 දෙසැම්බර් මාසයේදී ද ආරම්භ කෙරිණි. මෙම දිස්ත්‍රික්ක හතරෙහි ණයදීමේ කටයුතුද පිළිවෙලින් 1990 මැයි සහ දෙසැම්බර් යන මාසවලදී ආරම්භ කරන ලදී.

පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්කවල ණය ප්‍රතිලාභීන් සංඛ්‍යාව දළ වශයෙන් 18,770 ක් පමණ වන අතර ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක තුළ එය 14,100 පමණ වේ. ව්‍යාපෘතියේ මුළු අරමුදල රුපියල් දශ ලක්ෂ 517.9 ක් වන අතර, ඉන් සියයට 23 ක ප්‍රමාණයකට ශ්‍රී ලංකා රජය දායක වේ.

රජය, රාජ්‍ය නොවන ආයතන සහ විදේශීය නියෝජිත ආයතන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගි වේ. ව්‍යාපෘතියෙහි මූල්‍ය ආයතන ලෙස වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට එම දිස්ත්‍රික් හතරෙහි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට පවරනු ලැබ ඇත. කණ්ඩායම් මත ණය දීමේ ක්‍රමයේ වැදගත් කාර්ය භාරයක් සහභාගි වන ආයතන වලටද පැවරේ.

## බැංකු අධීක්ෂණ

1990 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු 13 ක් සහ එක් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් ද පරීක්ෂාවට භාජනය කළ අතර, වර්ෂය අවසාන වනවිට මින් නවයක පරීක්ෂණ කටයුතු නිම කරන ලදී. 1989 වර්ෂයේ දී පරීක්ෂණ ආරම්භ කළ එහෙත්, නිම කිරීමට නොහැකි වූ වාණිජ බැංකු තුනක පරීක්ෂණ කටයුතු ද මෙම වර්ෂයේදී නිම කෙරිණි.

වාණිජ බැංකු කාර්යාලයන්ගෙන් බැහැරව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කරගෙන යනු ලබන පරීක්ෂණ මෙහෙයවුම් අනුව වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරන ලද මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශනයන් පදනම් කරගෙන එම බැංකුවල මූල්‍ය තත්ත්වයන් පරීක්ෂා කිරීම නොකඩවා කරගෙන යන ලදී. වාණිජ බැංකුවල අත්තිකාරම් සඳහා වූ කාලීන වාර්තා සමීක්ෂණයෙන් සහ 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන වලට අනුකූලව ඉදිරිපත් කළයුතු අනෙක් වාර්තා විග්‍රහ කිරීම තුළින් වාණිජ බැංකු පිළිබඳව වූ අඛණ්ඩ අධීක්ෂණ තවදුරටත් ශක්තිමත් කෙරිණි. මීට අමතරව, ස්ථානගතව සහ බාහිරව කරන ලද පරීක්ෂණ මගින් හෙළි වූ කරුණු අනුව වාණිජ බැංකු විසින් අදළ නීති රීති රෙගුලාසි සහ නියෝගයන් කඩ කිරීම් පිළිබඳව සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට හැකි විණි.

වාණිජ බැංකු අඛණ්ඩ අධීක්ෂණ කටයුතු හැර, බැංකු පනත යටතේ නිකුත් කළ නියෝග, එනම්—අවම ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අනුපාත, එක් ණයකරුවකුට දිය හැකි ණය සීමාවන්, අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍යතා මත දෙන ණය සහ කොටස් දැරීම් පාලනය කිරීම් යනාදිය වාණිජ බැංකුව මගින් නිසි ලෙස ක්‍රියාත්මක කර ඇද්ද යන කරුණු පිළිබඳව දෙපාර්තමේන්තුව මගින් නොකඩවා පරීක්ෂා කරගෙන යන ලදී. තවදුරටත්, අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීමේ මිණුම් දණ්ඩක් වශයෙන් 1989 ජූනි මාසයේදී ප්‍රමුඛ නොවන අංශ වලට ණය දීමේ දී වාණිජ බැංකු වෙත පනවන ලද ණය සීමා සහ අත්‍යාවශ්‍ය නොවන විශේෂිත ආනයනයන් සඳහා වූ ණයවර ලිපි මත අය කළයුතු මුදල් ආන්තික අවශ්‍යතා සම්බන්ධයෙන් වාණිජ බැංකු දක්විය යුතු වූ අනුකූලතාවයන් ඉටු කර තිබේද යන්න මෙම දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කරන ලදී. වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන විදේශීය ව්‍යවහාර මුදල් සම්බන්ධ දෛනික තත්ත්ව වාර්තා මගින් එම බැංකු මත පනවන ලද විදේශ මුදල් ශේෂ සීමාවන් පවත්වා ගැනීම නිසි ලෙස ඉටු වී තිබේද යන්න පිළිබඳවත් මෙම දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරිණි. මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේදී සමානත්වයක් තිබීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින්, 1990 සැප්තැම්බර් මස 18 වැනි දිනැති ලංකාණ්ඩුවේ අංක 628/10 දරණ ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කිරීම මගින් බැංකු පනතේ V වන කොටස ක්‍රියාත්මක කිරීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. බැංකු පනතෙහි V වැනි කොටස ක්‍රියාත්මක

කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව මගින් ''බැංකු සඳහා වූ ගිණුම් ආකෘති'' හඳුන්වා දුන් අතර, එමගින් වාණිජ බැංකු විසින් වාර්ෂිකමූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේදී හෙළිදරව් කළ යුතු වූ අවම තත්ත්වයන් ස්ථාපනය කෙරිණි. අකර්මණ්‍ය අත්තිකාරම් සඳහා වූ පොළී අත්හිටුවීම සහ බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් කිරීමේදී වාණිජ බැංකු විසින් අනුගමනය කළයුතු උපදෙස් මාලාවක් හඳුන්වා දීමට ද මූලිකව ක්‍රියා කරන ලදී.

වාණිජ බැංකු විසින් ''විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය'' යටතේ පිහිටුවන ලද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල කටයුතු පාලනය එම බැංකු ඒකක වලින් ලබාගත් මාසික වාර්තා පදනම් කරගෙන නොකඩවා කරගෙන යන ලදී. මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා පදනම් කරගෙන දේශීය බැංකුවල සහ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ලාභදායීත්වය සමීක්ෂණය කෙරිණි.

අංක 32 'ඊ' දරණ මූල්‍ය නීති පනතේ නියෝගයන්ට අනුව 1987 අප්‍රේල් මාසයේදී ක්‍රියාත්මක කරනු ලැබූ තැන්පතු රක්ෂණ ක්‍රමය 1990 වර්ෂය තුළදී නොකඩවා පරිපාලනය කරන ලදී. අභිමතය පරිදි ඇතුළත් විය හැකි මෙම රක්ෂණ ක්‍රමයෙන් ආවරණය වීමේ අවස්ථාව වාණිජ බැංකුවලටද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ විවිධ සේවා සමුපකාර සමිතිවල සමුපකාර ග්‍රාමීය බැංකුවලටද සළසන ලදී.

1990 වර්ෂය තුළදී ග්‍රාමීය බැංකු ශාඛා 116 කින් සමන්විත විවිධ සේවා සමුපකාර සමිති 16 ක් මෙම ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීමට පෙර සළකා බැලීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයට භාජනය කරන ලදී.

1990 දෙසැම්බර් මස අග භාගය වනවිට වාණිජ බැංකු 2 ක්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 3 ක් සහ විවිධ සේවා සමුපකාර සමිති 8 ක ග්‍රාමීය බැංකු 65 ක් රක්ෂිත බැංකු සහ රක්ෂිත සමිති ලෙස ලියාපදිංචි කර තිබිණි.

## මූල්‍ය සමාගම් අධීක්ෂණය

මූල්‍ය සමාගම් වෙත 1989 දී රුපියල් දශ ලක්ෂ 6,527 ක් ව පැවති මුළු මහජන තැන්පතු ප්‍රමාණය 1990 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 6,707 දක්වා වැඩිවිය. මෙම වැඩිවීම සමාලෝචනය කළ යුත්තේ 1989 අවසානය වනවිට 60 ක් පමණ වූ ක්‍රියාකාරී මූල්‍ය සමාගම් සංඛ්‍යාව 1990 අවසානය වනවිට 40 ක් දක්වා අඩු වීමට හේතු වූ මූල්‍ය සමාගම් අංශයේ ප්‍රතිව්‍යුහකරණ වැඩපිළිවෙල ද සැළකිල්ලට ගනිමිනි. 1990 වර්ෂය අවසාන වන විට මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මූල්‍ය සමාගම් 20 ක් ලියාපදිංචි කොට මූල්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ බලපත් නිකුත් කරන ලදී. මෙම ලියාපදිංචි කළ මූල්‍ය සමාගම් වෙත වූ මුළු තැන්පතු ප්‍රමාණය 1990 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 5,423 ක් විය. 1990 දී මූල්‍ය සමාගම් වෙත වූ තැන්පතු ප්‍රමාණයේ සමස්ත වැඩිවීම සියයට 2.7 ක් වූ අතර එම කාලය තුළදී ලියාපදිංචි කළ සමාගම් 20 වෙත වූ තැන්පතුවල වැඩිවීම සියයට 12.2 ක් විය.

මහ බැංකුවේ ලියාපදිංචි කරන ලද මූල්‍ය සමාගම් නිරීක්ෂණය සහ අධීක්ෂණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. මේ සඳහා නිතිපතා ස්ථානගත පරීක්ෂණ හා සමාගම් විසින් සපයන ලද සංඛ්‍යා තොරතුරු පදනම් කරගත් නිරීක්ෂණ කටයුතු කරගෙන යනු ලැබීය. මහ බැංකුව විසින් කරනු ලබන මූල්‍ය සමාගම් අධීක්ෂණ හා විධිමත් කිරීමේ කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීමට හැකිවනු පිණිස, මහජන ආරක්ෂණ පනතේ (40 වැනි අධිකාරය) 5 වැනි වගන්තිය යටතේ පනවන ලද හදිසි රෙගුලාසි මගින් 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත සංශෝධනය කරන ලදී. ඉකුත් වසරේදී මෙන්ම, මූල්‍ය සමාගම් පිළිබඳව සවිස්තරාත්මක ස්ථානගත පරීක්ෂණ කරන ලදී. මූල්‍ය සමාගම් ලියාපදිංචි කිරීමට පෙරද, ඒ සඳහා සුදුසුකම් ඇති සමාගම්වල

ව්‍යාපාර කටයුතු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂණ කරනු ලැබීය. 1989 පෙබරවාරි මාසයේදී හඳුන්වා දෙන ලද කලින් අනතුරු හැඟවීමේ ක්‍රමය අනුව ස්ථානගත පරීක්ෂණ කටයුතු 1990 වසර තුළදී ද ක්‍රියාත්මක කෙරිණි.

අවිධිමත් කළමනාකරණය පැහැදිලිව පෙන්නුම් කළ එක් මූල්‍ය සමාගමක්, 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතේ 12(ඩී) වගන්තිය යටතේ මහ බැංකුව විසින් පත්කරන ලද ස්වාධීන විගණන සමාගමක් මගින් විමර්ශණාත්මක විගණනයකට භාජනය කරන ලදී. ඉන් අනතුරුව, පනතේ 18 (1) වගන්තිය යටතේ එම සමාගමේ ව්‍යාපාර කටයුතු අත්හිටුවන ලදුව, අත්හිටුවීමේ කාලසීමාව අවසානයේදී සමාගමේ මූල්‍ය ව්‍යාපාර කටයුතු අවසන් කරන ලෙසත්, තැන්පතු වගකීම් බේරුම් කිරීම සඳහා වැඩ පිළිවෙලක් ඉදිරිපත් කරන ලෙසත් නියෝග කරන ලදී.

**සමාගම් ලියාපදිංචි කිරීම**

1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතේ 2 වන වගන්තිය ප්‍රකාර, මූල්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාම නීත්‍යානුකූල වනුයේ රුපියල් දශ ලක්ෂ 5 කට නොඅඩු නිකුත් හා ගෙවා නිම් ප්‍රාග්ධනයක් සහිතව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් ලියාපදිංචි වූ සහ මහ බැංකුව වෙත ලියාපදිංචි වූද සමාගම්වලට පමණි. එසේ වුවද, මූල්‍ය සමාගම් පනත පනවන ලද දිනයට පෙර දිනයෙහි මූල්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන ගිය ආයතනවලට මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි වීම සඳහා පනත ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් පනත මගින්ම ලබා දී තිබුනි. 1990 දෙසැම්බර් 18 වැනි දින මෙම කාලසීමාව අවසන් වූ අතර, ලියාපදිංචි නොවූ මූල්‍ය සමාගම් විසින් මූල්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාම නීති විරෝධී බව පුවත්පත් මගින් මහජනයා වෙත දැනුම් දෙන ලදී.

මහ බැංකුව විසින්, 1988 මූල්‍ය සමාගම් පනතේ විධිවිධාන පරිදි මූල්‍ය සමාගම් ලියාපදිංචි කිරීමේ කටයුතු 1990 පසු භාගයේදී අරඹන ලදී. පනත යටතේ මූල්‍ය සමාගම් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර දීම පිළිබඳ නීතිරීති සහ නියමිත අයදුම්පත් ආකෘති පත්‍ර 1990 ජූනි මාසයේදී ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, 1990 වර්ෂය තුළදී මූල්‍ය සමාගම් 30 ක් ඒ සඳහා අයදුම් කර තිබිණි. 1990 අවසානය වනවිට, මෙම සමාගම්වලින් ලියාපදිංචිය සඳහා නියමිත අවශ්‍යතා සපුරන ලද සමාගම් 20 කට මාස 12 ක කාලසීමාවක් සඳහා මූල්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත් නිකුත් කරන ලදී.

1990 දෙසැම්බර් 18 වැනි දින වනවිට ලියාපදිංචි කර නොමැති මූල්‍ය ආයතනවල මූල්‍ය ව්‍යාපාර අවසන් කරන ලෙසත්, 1990 දෙසැම්බර් 17 වැනි දින මුදල් මණ්ඩලය විසින් කරන ලද 1990 අංක 2 දරණ නියෝගය නිකුත් කළ දින සිට දින 30 ක් ඇතුළත තැන්පතුකරුවන්ට ඇති වගකීම් බේරුම් කිරීම ආරම්භ කරන ලෙසත් නියෝග කරන ලදී. අංක 2 දරණ නියෝගය අනුව, ලියාපදිංචි නොකළ මූල්‍ය සමාගම් විසින් ඔවුන්ගේ තැන්පතු වගකීම් පහත දැක්වෙන ආකාරයට ගෙවා බේරුම් කළයුතු විය.

(i) 1990.12.19 වැනි දිනට රුපියල් දශ ලක්ෂ 40.0 කට වැඩි තැන්පතු වගකීමක් ඇති මූල්‍ය ආයතන විසින්, එකී තැන්පතුවලින් මසකට සියයට 5 කට නොඅඩු ප්‍රමාණයක් ආපසු ගෙවිය යුතුය.

(ii) රුපියල් දශ ලක්ෂ 40.0 නොවැඩි තැන්පතු ප්‍රමාණයක් ඇති මූල්‍ය ආයතන විසින් එම තැන්පතුවලින් මසකට සියයට 8.5 කට නොඅඩු ප්‍රමාණයක් ආපසු ගෙවිය යුතුය.

මුදල් මණ්ඩලය විසින් පරිපාලනය හා කළමනාකරණය පවරා ගන්නා ලද මූල්‍ය සමාගම් පහක අධ්‍යක්ෂවරුනට විරුද්ධව අපරාධ නඩු පැවරිය හැකිද යන්න සොයා බැලීම පිණිස එකී සමාගම් පිළිබඳ විමර්ශන වාර්තා 1990 වර්ෂය තුළදී නීතිපති වෙත ඉදිරිපත් කරන ලදී. පසුව, මෙම වාර්තාවලින් දෙකක්, තවදුරටත් සාක්ෂි රැස්කර ගැනීම සහ නීතිමය කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවම ඉදිරිපත් කර ඇත.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින්, 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ වැරදි කිහිපයක් සඳහා මූල්‍ය සමාගම් 9 ක අධ්‍යක්ෂවරුන් 46 කට විරුද්ධව කොළඹ–කොටුව, ගම්පහ සහ පානදුර මහේස්ත්‍රාත් උසාවිවල නඩු 75 ක් පවරා ඇත. නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර 2.3 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. මෙයට අමතරව, මුදල් මණ්ඩලය වෙත පවරා ගත් මූල්‍ය සමාගම්වලට අයවිය යුතු වූ ණය අයකර ගැනීම සඳහා නඩු 69 ක් පවරා ඇත. මෙයින් 7 ක් පමණ ඇත්තේ අධ්‍යක්ෂවරුනට විරුද්ධවය.

**2.3 වැනි සංඛ්‍යා සටහන**

**1990. 12. 31 වැනිදයින් අවසන් වන වර්ෂය තුළදී, 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ වැරදි සඳහා පවරන ලද නඩු**

| වරදෙහි ස්වභාවය | සමාගම් සංඛ්‍යාව | නඩු පවරනු ලැබූ අධ්‍යක්ෂවරු සංඛ්‍යාව ** | නඩු සංඛ්‍යාව | වෙනත් කරුණු | |
|---|---|---|---|---|---|
| | | | | වරදකරු බවට තීන්දු | මෙතෙක් තීන්දු දී නොමැති |
| 1. මාසික සාමාන්‍ය තැන්පතු වගකීම් වලින් සියයට 6 ක් අනුමත කළ සුරකුම් පත්වල ආයෝජනය නොකිරීම .. | 05 | 22 | 27 | — | 27 |
| 2. තැන්පතු වගකීම් වලින් සියයට 15 ක් ද්‍රවශීල වත්කම් ලෙස පවත්වා ගැනීමට අපොහොසත්වීම .. | 01 | 05 | 05 | — | 05 |
| 3. අවසර ලබා නොගෙන ව්‍යාපාරික ස්ථානය මාරු කිරීම .. | 01 | 07 | 07 | 06 | 01 |
| 4. විගණනය කළ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම .. | 05 | 21 | 21 | 08 | 10* |
| 5. වත්කම් සහ වගකීම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම .. | 01 | 05 | 15 | — | 15 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන් : * නඩු 3 ක් සමථ කර ඇත.
** විවිධ වැරදි සඳහා ඇතැම් අධ්‍යක්ෂවරුනට විරුද්ධව කීපවරක් නඩු පවරා ඇත.

මහජන ආරක්ෂක පනතේ (40 වැනි අධිකාරය) 5 වැනි වගන්තිය යටතේ, ජනාධිපතිතුමා විසින් මූල්‍ය සමාගම් පනතට පහත සඳහන් සංශෝධන කර ඇත.

(අ) 1990 අංක 1 දරණ හදිසි අවස්ථා (මුදල් සමාගම්) නියෝග ප්‍රකාර, 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනතේ 25 වැනි වගන්තිය, එහි 1 වැනි උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට නව උප වගන්තියක් යොද සංශෝධනය කරන ලදී. මෙහි අරමුණ වූයේ, මුදල් සමාගමකට අයිති යම් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන්

හෝ වෙනත් ආකාරයකට අනිසි ලෙස උපයෝගී කර ගැනීමෙන්, වංචනික ලෙස, සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස තමාම පොහොසත්වීම හෝ යම් ක්‍රියාවක් නොකර හැරීමේ හේතුවෙන් වෙනත් තැනැත්තෙකුට පොහොසත් වීමට ඉඩ හැරීම සම්බන්ධයෙන් එකී සමාගමේ අධ්‍යක්ෂවරුනට, ප්‍රධාන විධායකයාට, කළමනාකරුට, සේවකයකුට හෝ අනුයෝජිතයෙකුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා 25 වැනි වගන්තියට ඇතුළත් කොට ඇති විශේෂ ක්‍රියාමාර්ගය තවදුරටත් ශක්තිමත් කිරීමය.

(ආ) 1990 අංක 2 දරණ හදිසි අවස්ථා (මුදල් සමාගම්) රෙගුලාසි අනුව, 12(ආ) නව වගන්තිය පනතට ඇතුලත් කරන ලදී. ලියාපදිංචි කරන ලද මූල්‍ය සමාශම්වල කටයුතු ගැන පරීක්ෂාවෙන් සිටීමේ කාර්යය සඳහා නියෝජිතයන් පත් කිරීමට මුදල් මණ්ඩලයට බලය දීම මෙම සංශෝධනයේ අරමුණ විය.

1989 දී ආරම්භ කළ තැන්පතුකරුවන්‍ට සහන සැළසීමේ ක්‍රමය 1990 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්වල තැන්පතුකරුවනට සහන සැළසීමේ ක්‍රමයේ ප්‍රගතිය 2.4 සංඛ්‍යා සටහනෙහි දක්වේ. සහන සැළසීමේ ක්‍රමය යටතේ මුදල් ගෙවීම සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයන ලද්දේ, මහ බැංකුවේ මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ එකී මූල්‍ය සමාගම්වලට දෙන ලද ප්‍රතිමූල්‍ය ණය මගිනි. මෙකී සමාගම් සඳහා දෙන ලද මුළු ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 214 ක් විය.

### 2 . 4 සංඛ්‍යා සටහන

### 1990 දෙසැම්බර් දක්වා තැන්පතුකරුවනට ගෙවන ලද සහන මුදල් පිළිබඳ ප්‍රගතිය

| සමාගමේ නම | | මුළු තැන්පතු සංඛ්‍යාව (1) | ගෙවන ලද තැන්පතු සංඛ්‍යාව (2) | ගෙවන ලද තැන්පතු සංඛ්‍යාව මුළු තැන්පතුවල ප්‍රතිශතයක් ලෙස (3) | ගෙවන ලද මුදල (රුපියල්–දහස්) (4) |
|---|---|---|---|---|---|
| සී/ස යූනියන් ට්‍රස්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් | .. | 18,331 | 13,245 | 72·2 | 144,080 |
| සී/ස හිදෙකි පිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් | .. | 4,487 | 4,131 | 92·1 | 44,238 |
| සී/ස හෝම් පිනෑන්ස් | .. | 12,585 | 2,972 | 23·6 | 26,685 |
| සී/ස සාරභූමි ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්ගලික) සමාගම | .. | 401 | 358 | 89·3 | 3,678 |
| සී/ස පිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගම | .. | 3,198 | 401 | 12·5 | 1,151 |
| සී/ස කාසල් පිනෑන්ස් | .. | 2,756 | 2,479 | 89·9 | 30,814 |
| එකතුව | .. | 41,758 | 23,586 | 56·5 | 250,646 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

මහ බැංකුවේ සහ රාජ්‍ය නොවන ආයතනයක අනුග්‍රහයෙන්, 1990 ජූලි 28 වෙනි දින බැංකු නොවන මූල්‍ය අංශයේ ප්‍රතිව්‍යුහකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්විණි. මූල්‍ය සමාගම්වල, විගණන හා නීතිඥ ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හා මහජනයා මෙම සම්මේලනයට සහභාගි විය. මූල්‍ය සමාගම් අංශය ප්‍රතිව්‍යුහකරණය පිළිබඳව පුළුල් මාතෘකා රැසක් මෙම සමුළුවේදී සාකච්ඡාවට භාජනය කෙරිණි. මහ බැංකුවේ අධිපති ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක මහතා " අනූවේ දශකය සඳහා මූල්‍ය අංශය ප්‍රතිව්‍යුහකරණය කිරීම " මැයෙන් දේශනයක් කළ අතර, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය එන්. එල්. සිරිසේන මහතා විසින් " මුදල් සමාගම්වල කළමනාකරණ ක්‍රම දියුණු කිරීම " යන්නෙන් සාකච්ඡා ලිපියක් ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුග්‍රාහකත්වයෙන් 1990 ජනවාරි 29 වැනි දින සිට මාර්තු 2 වැනි දින දක්වා කොළඹ දී පවත්වන ලද, මූල්‍ය ආයතන පරීක්ෂාව සහ අධීක්ෂණය පිළිබඳ 15 වැනි අග්නිදිග ආසියානු මහ බැංකු (සියැසන්) පුහුණු පාඨමාලාව, මලයාසියාවේ ක්වාලාලම්පූර්හි '' සියැසන් '' පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සමග එක්ව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. ඉන්දුනීසියාව, මැලේසියාව, නේපාලය, පිලිපීනය, තායිලන්තය හා ශ්‍රී ලංකාව යන රටවල්වල මහ බැංකු නිලධාරීන් 27 දෙනෙක් මෙම පුහුණු පාඨමාලාවට සහභාගි වූහ.

## සංවර්ධන මුදල්

1990 වර්ෂය තුළදී ද මැදි හා දිගුකාලීන ණය අරමුදලේ පරිපාලන කටයුතු සහ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා වූ ණය සහතික ක්‍රමයන් මෙහෙයවීම තවදුරටත් සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරුනු වගකීම විය.

### මැදි හා දිගුකාලීන ණය අරමුදල

1989 වර්ෂයේදී අනුමත කරන ලද රුපියල් දශ ලක්ෂ 440 හා සසඳා බලන කල කාණ්ඩ II, III, IV සහ අදාල වූ කර්මාන්ත සඳහා වන විශේෂිත ප්‍රතිමූල්‍ය පහසුකම් වශයෙන් මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව 1990 වර්ෂය තුළදී අනුමත කළ මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 908 ක් විය. 1990 වර්ෂය තුළදී අපනයන ව්‍යාපෘතීන් සඳහා වන කාණ්ඩ II යටතේ නිමි ඇඳුම් නිෂ්පාදනය, ඉස්සන් ඇති කිරීම සහ අත්කම් භාණ්ඩ නිෂ්පාදනය ඇතුළුව ව්‍යාපෘති 07 ක් සඳහා ප්‍රදානය කළ ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 23 ක් වූ අතර, එය පෙර වර්ෂය හා සසඳන කළ සියයට 29 ක අඩුවීමකි. සංචාරක හෝටල් සඳහා දෙන ලද ණය මුදල්හි හිඟ හිට ඇති පොළිය ප්‍රාග්ධනගත කිරීම හා කෘෂිකර්මය සඳහා 1990 වර්ෂය තුළදී ප්‍රතිමූල්‍ය අනුමත කරනු නොලැබිණි. ගෙතුම් රෙදිපිළි නිෂ්පාදන ඒකකයන් හා රෙදිපිළි සැකසුම් ඒකකයන් ද ඇතුළුව කර්මාන්ත අංශයට සපයනු ලැබූ ණය මුදල් සඳහා රුපියල් දශ ලක්ෂ 72 ක ප්‍රතිමූල්‍ය සපයනු ලැබිණ. අනෙකුත් අංශයන් වෙත අනුමත කළ ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 26 ක් වූ අතර එයට පෞද්ගලික ආරෝග්‍යශාලා දෙකක් ඉදිකිරීම හා වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් අනුමත ප්‍රතිමූල්‍ය පහසුකම් ඇතුළත් වේ. 1990 වර්ෂය තුළ අනුමත කරනු ලැබූ වැඩිම ප්‍රතිමූල්‍ය ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 787 ක් අදාල වූ කර්මාන්ත සඳහා ආධාර ලෙසින් සැපයිණි. මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් පිළිබඳ විස්තරයක් 2.5 වන සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

1990 වර්ෂය තුළ සංචාරක හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය විසින් කරන ලද නියෝජනයන් මත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පහත දැක්වෙන කරුණු සඳහා ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයන් 1990 දෙසැම්බර් මස 06 වන දින අනුමත කරනු ලැබීය.

(1) ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කළ සංචාරක හෝටල් අළුත්වැඩියා කිරීම/වත්කම් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම.

මෙම කාර්‍ය්‍යය සඳහා අනුමත ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 200 කි.

(2) සංචාරකයින් ප්‍රවාහනය සඳහා ආසන සංඛ්‍යාව 30 න් හෝ ඊට වැඩි බස්රථ/කෝච් රථ ආනයනය කිරීම. මෙම කාර්යය සඳහා අනුමත ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 100 කි.

ඉහත යෝජනා ක්‍රමයන් සඳහා අදාළ ප්‍රතිමූල්‍ය පහසුකම් මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි කාණ්ඩ අංක IV යටතේ ප්‍රදානය කරනු ලැබූ අතර, මෙම යෝජනා ක්‍රමය සඳහා මෙහෙයුම් උපදෙස් සියළුම ණය දෙන ආයතන වෙත 1990 දෙසැම්බර් මස 14 වැනි දින නිකුත් කරනු ලැබිණි. එසේ වුවද, 1990 වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් ප්‍රතිමූල්‍ය අයදුම්පත් කිසිවක් නොලැබිණි.

## 2 . 5 සංඛ්‍යා සටහන
## මැදි හා දිගුකාලීන ණය අරමුදල
## (කාණ්ඩ II, III සහ IV ප්‍රතිමූල්‍ය අනුමත කිරීම)
## 1988 – 1990

(රුපියල් දශ ලක්ෂ)

| කාණ්ඩය | 1988 | | 1989 | | 1990 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| II අපනයන අංශය III සහ IV .. | 27·2 | 19·0 | 46·2 | 32·3 | 32·7 | 22·9 |
| (අ) කෘෂිකර්මය .. | 72·0 | 43·2(අ) | 14·7 | 8·8(අ) | — | — |
| (ආ) කර්මාන්ත .. | 2·8 | 1·7 | 35·4 | 21·2 | 72·6 | 71·6 |
| (ඇ) හෝටල් .. | — | — | — | — | — | — |
| (ඇ) අනෙකුත් .. | 15·0 | 15·0 | 80·0 | 80·0 | 43·5 | 26·1 |
| අඩාල වූ කර්මාන්ත සඳහා ආධාර .. | 272·6 | 175·8(ආ) | 463·1 | 298·2(ඇ) | 787·4 | 787·4 |
| එකතුව .. | 389·6 | 254·7 | 639·4 | 440·5 | 936·2 | 908·0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) මැදි කාලීන ආයෝජන වැඩ සටහන යටතේ වැවිලි භෝග ව්‍යාපෘති සඳහා ලංකා බැංකුවට 1988 දී ප්‍රදානය කරන ලද ණය මුදල් 04 ක් හා 1989 වර්ෂයේදී ප්‍රදානය කරන ලද එක් ණය මුදලක් ඇතුළත්ය.

(ආ) සංචාරක හෝටල් දෙකක් නවීකරණය කිරීම සඳහා දෙන ලද ණය මුදල් 02 සහ සංචාරක හෝටල් ව්‍යාපෘතීන් 13 කට දෙන ලද ණය මුදල් සඳහා හිඟහිට ඇති පොලිය ප්‍රාග්ධනගත කිරීම ද ඇතුළත්ය.

(ඇ) සංචාරක හෝටල් ව්‍යාපෘතීන් 27 ට දෙන ලද ණය මුදල් සඳහා හිඟහිට ඇති පොලිය ප්‍රාග්ධනගත කිරීම ඇතුළත්ය.

### ණය සහතික කටයුතු

1990. 12. 31 දිනට මහ බැංකුව විසින් පාලනය කෙරෙන ණය සහතික යෝජනා ක්‍රමයන් හතර යටතේ වූ ණය සහතික කටයුතුවල සාරාංශයක් 2.6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) යෝජනා ක්‍රමය

සු. පරි. ක. යෝජනා ක්‍රමය යටතේ ණය සහතික නිකුත් කිරීම 1978 දී ආරම්භ කළ අතර, 1981 දී එම කටයුතු අවසන් විය. මෙම කාලපරිච්ඡේදය තුළදී සහතික කරන ලද 767 ක් වූ මුළු ණය සංඛ්‍යාවෙන් රුපියල් දශ ලක්ෂ 23 ක් වූ ණය ගිවිසුම් 593 ක් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 4 ක වටිනාකම ඇති සහතික 71 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව ණය දෙන ආයතනවලට (ස. ණ. ආ) නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබිණි. 1990 වර්ෂය අවසානය වනවිට ලැබී තිබුනු රුපියල් දශ ලක්ෂ 2.4 ක ප්‍රමාණයක වගකීමක් සහිත හිමිකම්පෑම් 88 කින් රුපියල් දශ ලක්ෂ 1.7 ක ප්‍රමාණයක් සඳහා වන හිමිකම්පෑම් 63 ක් සමතයකට පත් කරන ලද අතර, එක් වගකීමක් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් සියයට 50 ක ප්‍රමාණයක් නොඉක්මවන පරිදි රු. 400,000 ප්‍රමාණයක අතුරු ගෙවීමක් සිදුකරන ලදී. රුපියල් දශ ලක්ෂ 0.22 ක ප්‍රමාණයක් සඳහා වන හිමිකම්පෑම් 07 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම හේතුකොටගෙන ප්‍රතික්ෂේප කරන ලදී. රුපියල් දශ ලක්ෂ 0.24 ක ප්‍රමාණයක ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් යුත් ණය 16 කට අදාල හිමිකම්පෑම් ණයකරුවන් විසින් අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා නිම කරන ලද අතර, ස. ණ. ආ. විසින් ණය මුදල ප්‍රතිලේඛණගත කිරීම නිසා, ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 27 ක් වූ එක් හිමිකම්පෑමක් සළකා බැලීම පසුවට කල් තැබුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ 1990 අවසානය වනවිට ස. ණ. ආ. වෙතින් රැස් කරන ලද මුළු ඇප වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 0.92 ක් වන අතර, පශ්චාත් හිමිකම් අයකර ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 0.36 ක් විය.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික

| යෝජනා ක්‍රම සහ වර්ෂ / ශීර්ෂය | සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) | | | | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සු. ම. ක. I | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | | 1990 | | 1989 | | 1990 | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| 1·1 අනුමත කරන ලද ණය .. | 767 | 31·20 | 767 | 31·20 | 1,670 | 286·10 | 1,670 | 286·10 |
| 1·2 සහතික කරන ලද ණය .. | 767 | 23·40(අ) | 767 | 23·40(අ) | 1,670 | 157.50(ආ) | 1,670 | 157.50(ආ) |
| 2·1 සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය .. | 584 | 22·54 | 593 | 22·90 | 1,142 | 148·59 | 1,189 | 168·69 |
| 2·2 ඉවත් කරන ලද හෝ අවලංගු කරන ලද ණය සහතික .. | 64 | 3·94 | 71 | 4·04 | 78 | 23·18 | 85 | 24·51 |
| හිමිකම් පෑම | | | | | | | | |
| 3·1 ලැබූ මුළු හිමිකම් පෑම් .. | 83 | 4·29(උ) | 88 | 4·32(උ) | 320 | 72·22(උ) | 327 | 73·30(උ) |
| 3·2 ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම .. | | 2·41 | | 2·42 | | 31·58 | | 31·73 |
| 3·3 හිමිකම් සමතයට පත්කිරීම | | | | | | | | |
| 3·3·1 සම්පූර්ණයෙන් ගෙවීම් කළ හිමිකම් .. | 57 | 1·66 | 63 | 1·68 | 216 | 17·32 | 220 | 17·62 |
| 3·3·2 අතුරු ගෙවීම් කළ හිමිකම්(50%) | — | — | 01 | 0·004 | 27 | 1·95 | 28 | 2·11 |
| 3·3·3 ප්‍රතික්ෂේප කළ හිමිකම් .. | 06 | 0·22 | 07 | 0·22 | 25 | 5·31 | 26 | 4·72 |
| 3·3·4 හිමිකම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලද ණය (ඌ) .. | 16 | 0·24 | 16 | 0·24 | 35 | 1·52 | 37 | 2·03 |
| 3·3·5 සලකාබැලීම පසුවට කල්තබන ලද හිමිකම් (එ) .. | — | — | 01 | 0·27 | 11 | 2·34 | 12 | 3·04 |
| 3·3·6 තීරණ ගෙන නොමැති හිමිකම් (ඒ) .. | 04 | 0·29 | — | — | 06 | 1·19 | 04 | 0·09 |
| 1· නොපියවන ලද ණය මුදල් (1·1 – 2·1 – 2·2 – 3·3·1 3·3·2 – 3·3·3) .. | 56 | 1·43(ඒ) | 32 | 1·14(ඒ) | 182 | 25·77(ඒ) | 122 | 17·76(ඒ) |
| 2· (එයින් හිඟ හිටි ණය) .. | 56 | 1·43(ඒ) | 32 | 1·14(ඒ) | 154 | 22·14(ඒ) | 117 | 17·02(ඒ) |
| 3· ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම .. | 56 | 1·07(අ) | 32 | 0·86(අ) | 182 | 15·01(අ) | 122 | 10·32(අ) |
| රැස් කරන ලද ඇප වාරික මුදල් .. | | 0·91 | | 0·92 | | 11·63 | | 11·84 |
| පශ්චාත් හිමිකම් අයකර ගැනීම .. | | 0·16 | | 0·36 | | 1·15 | | 2·75 |

(අ) ණය ශේෂයන්ගෙන් සියයට 75 ක ප්‍රමාණය.

(ආ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 0·4 උපරිමයකට යටත්ව ණය ශේෂයෙන් සියයට 60 ක ප්‍රමාණය.

(ඇ) රුපියල් දශ ලක්ෂ 2·0 ක් දක්වා වූ ණය සම්බන්ධයෙන් රුපියල් දශ ලක්ෂ 0·8 දක්වා සහ රුපියල් දශ ලක්ෂ 2·0 සිට රුපියල් දශ ලක්ෂ 4·0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 1·2 ක් දක්වා උපරිමයකට යටත්ව ණය ශේෂයන්ගෙන් සියයට 60 ක ප්‍රමාණය.

(ඈ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 1·6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2·0 ක් දක්වා වූ ණය, රුපියල් දශ ලක්ෂ 2·0 සිට 3·0 දක්වා වූ ණය සහ රුපියල් ලක්ෂ 3·0 සිට 4·0 දක්වා වූ ණය සම්බන්ධයෙන් ණය ශේෂයන්ගෙන් පිළිවෙලින් සියයට 80, 60 සහ 40 ප්‍රමාණය.

(ඉ) 1989 අවසාන වන විට මුදහැර ඇති බවට වාර්තා වී නොමැති රුපියල් දශ ලක්ෂ 259·4 ක මුදලක් සඳහා වූ ණය 290 ක් ඇතුළත්ය.

(ඊ) 1990 අවසාන වන විට මුදහැර ඇති බවට වාර්තා වී නොමැති රුපියල් දශ ලක්ෂ 220·8 ක මුදලක් සඳහා වූ ණය 346 ක් ඇතුළත්ය.

(උ) ගෙවීම් පැහැර හැර ඇති ණය මුදල් එකතු වූ පොළියත් සමඟ

(ඌ) 2·1 යටතේ අඩංගු වී ඇත.

(එ) 4·1 යටතේ අඩංගු වී ඇත.

(ඒ) අයකර ගත් ණය වාරික හැර.

2 . 6 වන සංඛ්‍යා සටහන

ක්‍රමයන්හි 1990. 12. 31 දිනට පැවැති සාරාංශය

(රුපියල් දශ ලක්ෂ)

| සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සු. ම. ක. II | | | | සු. ම. ක. III | | | |
| 1989 | | 1990 | | 1989 | | 1990 | |
| සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| 2,531<br>2,531 | 1,392·54<br>713.63(ඇ) | 2,531<br>2,531 | 1,392·54<br>713.63(ඇ) | 1 047(ඉ)<br>1,047 | 636·95<br>440.07(ඇ) | 2,340(ඊ)<br>2,340 | 1,383·23<br>955.88(ඇ) |
| 230 | 51·97 | 487 | 149·90 | 3 | 4·41 | 12 | 7·81 |
| 180 | 105·65 | 238 | 129·95 | 14 | 4·55 | 97 | 74·91 |
| 110 | 63·51(උ)<br>27·31 | 144 | 66·25(උ)<br>36·17 | —<br>— | —<br>— | 03 | 1·35(උ)<br>0·89 |
| 48<br>09<br>19 | 8·26<br>0·87<br>3·59 | 76<br>08<br>32 | 18·73<br>0·82<br>7·61 | —<br>—<br>01 | —<br>—<br>0·56 | 01<br>—<br>01 | 0·01<br>—<br>0·56 |
| 02 | 0·58 | 02 | 0·58 | — | — | — | — |
| 16 | 5,34 | 22 | 6·54 | — | — | 01 | 0·32 |
| 16 | 7·80 | 04 | 1·07 | — | — | — | — |
| 2,045<br>548 | 812·38(ඒ)<br>267·62(ඒ) | 1,690<br>739 | 604·61(ඒ)<br>192·51(ඒ) | 739<br>48 | 347·12(ඒ)<br>1·52(ඒ) | 1,883<br>181 | 975·58(ඒ)<br>18·02(ඒ) |
| 2,045 | 445·06(ඇ) | 1,690 | 337.69(ඇ) | 739 | 198.73(ඇ) | 1,883 | 604·70(ඇ) |
| | 18·43 | | 22·69 | | 2·14 | | 8·32 |
| | 0·04 | | 0·67 | | — | | — |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත—1 (සුමක—1) යෝජනා ක්‍රමය

සුමක—1 යෝජනා ක්‍රමයේ කටයුතු 1979 දී ආරම්භ වූ අතර, 1982 දී අවසන් විය. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 286 ක ප්‍රමාණයක ණය මුදල් ආවරණය වන පරිදි නිකුත් කරන ලද මුළු සහතික සංඛ්‍යාව 1,670 කි. නිකුත් කරන ලද මුළු සංඛ්‍යාව අතුරින් 1,189 ක ණය සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 24.5 ක ප්‍රමාණයක ණය සහතික 85 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස. ණ. ආ. වලට නිකුත් කළ මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබිණි. 1990 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 31.7 ක වගකීමක් සහිත හිමිකම්පෑම් 327 ක් ලැබුණු අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 17.6 ක් වන හිමිකම්පෑම් 220 ක් සමථයකට පත් කරන ලද අතර, පෙර සඳහන් කළ තීරණය මත උතුර හා නැගෙනහිර දිස්ත්‍රික්කයන්හි ස. ණ. ආ. විසින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම්පෑම් 28 ක් වෙනුවෙන් ව්‍යාපෘති පරීක්ෂණයක් නොමැතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් සියයට 50 ක් නොඉක්මවන පරිදි රුපියල් දශ ලක්ෂ 2.1 ක ප්‍රමාණයක අතුරු ගෙවීමක් සිදුකොට ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස. ණ. ආ. ට නිකුත් කරන ලද උපදෙස් අනුගමනය නොකිරීම නිසා රුපියල් දශ ලක්ෂ 4.7 ක ප්‍රමාණයක හිමිකම්පෑම් 26 ක් ප්‍රතික්ෂේප කරන ලද අතර, රුපියල් දශ ලක්ෂ 2 ක ප්‍රමාණයක ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමකින් යුතු ණයදීම් 37 කට අදාල හිමිකම්පෑම් අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ආපසු ගෙවා නිම කරන ලදී. රුපියල් දශ ලක්ෂ 3 ක ප්‍රමාණයක හිමිකම්පෑම් 12 ක් හා සම්බන්ධයෙන් වන ණය මුදල් ස. ණ. ආ. විසින් ව්‍යාපෘති පුනරුත්ථාපන වැඩපිළිවෙලවල් ආරම්භ කිරීම නිසා හෝ ණයකරුවන් විසින් ණය මුදල් ආපසු ගෙවීම ආරම්භ කිරීම නිසා, හෝ සළකා බැලීම පසුවට කල් තබා ඇත. 1990 අවසානය වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස් කරන ලද මුළු ඇප වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11.8 ක් වූ අතර මෙම දිනය වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව ලද පශ්චාත් හිමිකම් අයකර ගැනීම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2.8 ක් විය.

### සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත II (සුමක II) යෝජනා ක්‍රමය

සුමක II යෝජනා ක්‍රමය යටතේ ණය සහතික නිකුත් කිරීම 1982 දී ආරම්භ වූ අතර, 1989 දී එම කටයුතු අවසන් විය. මෙම කාලපරිච්ඡේදය තුළදී නිකුත් කරන ලද මුළු ණය සහතික සංඛ්‍යාව 2,531 ක් වූ අතර ඉන් රුපියල් දශ ලක්ෂ 150 ක ප්‍රමාණයක වටිනාකම ඇති ණය 487 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 130 ක වටිනාකම ඇති සහතික 238 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස. ණ. ආ. වලට නිකුත් කරන ලද උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී තිබුණි. 1990 වර්ෂය අවසානය වනවිට ලැබී තිබුනු රුපියල් දශ ලක්ෂ 36 ක වගකීමක් සහිත හිමිකම්පෑම් 144 කින් රුපියල් දශ ලක්ෂ 18.7 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 76 ක් සමථයකට පත් කරන ලද අතර, පෙර සඳහන් කළ තීරණය පරිදි උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්කයන් සම්බන්ධයෙන් වන හිමිකම්පෑම් 8 ක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් සියයට 50 ක් නොඉක්මවන පරිදි රුපියල් දශ ලක්ෂ 0.8 ක අතුරු ගෙවීමක් සිදුකොට ඇත. ස. ණ. ආ. විසින් මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා රුපියල් දශ ලක්ෂ 7.6 ක වටිනාකම ඇති හිමිකම්පෑම් 32 ක් ප්‍රතික්ෂේප කෙරුණි. ණය දෙකකට අදල හිමිකම් ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ආපසු ගෙවා නිමකර ඇත. රුපියල් දශ ලක්ෂ 6.5 ක් වන හිමිකම්පෑම් 22 ක් ස. ණ. ආ. විසින් ව්‍යාපෘති පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීම නිසා හෝ ණයකරුවන් විසින් ණය මුදල් ආපසු ගෙවීම ආරම්භ කිරීම නිසාවෙන් හෝ සළකා බැලීම පසුවට කල් තබා

ඇත. 1990.12.31 දින වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස් කරන ලද මුළු ඇප වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 22.6 ක් වූ අතර, මෙම දිනය වනවිට පශ්චාත් හිමිකම් අයකර ගැනීම්වල ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 0.67 ක් විය.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත III (සුමක III) යෝජනා ක්‍රමය**

සුමක III යෝජනා ක්‍රමය යටතේ ණය සහතික නිකුත් කිරීම 1988 ජූලි මාසයේදී ආරම්භ වූ අතර, 1990 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 1,383 ක වටිනාකම ඇති ණය සහතික 2,340 ක් නිකුත් කොට ඇත. මින් රුපියල් දශ ලක්ෂ 7.8 ක වටිනාකම ඇති සහතික 12 ක් සඳහා වන ණය මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කොට ඇති අතර, රුපියල් දශ ලක්ෂ 74.9 ක වටිනාකම ඇති ණය සහතික 97 ක් මහ බැංකුව විසින් ස. ණ. ආ. වලට නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී ඇත. 1990 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 0.89 ක ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමක් සහිත හිමිකම්පෑම් 3 ක් ලැබූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 0.01 ක් සඳහා වන එක් හිමිකම් පෑමක් සමතයකට පත් කරන ලද අතර, රුපියල් දශ ලක්ෂ 0.56 ක් වූ තවත් එක් හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කෙරිණි. 1990.12.31 දිනට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස් කරන ලද මුළු ඇප වාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8.3 කි.

මෙම වසර තුළ ජාතික සංවර්ධන බැංකුව සමග කුරුණෑගල හා කෑගල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සීමාසහිත සෙලාන් බැංකුව සහභාගිත්ව ගිවිසුමකට අත්සන් කරන ලද අතර, දැනට ස. ණ. ආයතන වශයෙන් ක්‍රියා කරනු ලබන ලංකා බැංකුව, මහජන බැංකුව, සංවර්ධන මූල්‍ය සමායතනය, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව සහ සීමාසහිත සම්පත් බැංකුවට අමතරව එම ආයතනවලට ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රමය යටතේ සුමක ණය මුදල් ප්‍රදානය කිරීමේ සුදුසුකම් හිමිවිණි.

සුමක II සහ III ක්‍රම යටතේ ව්‍යාපෘතීන්වල කර්මාන්ත අනුව කරන ලද වර්ගීකරණයක් 2.7 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

සුමක ණය සහතික අරමුදල, 1990 අවසන් වනවිට භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 189.8 ක් වූ අතර ආයෝජනයන්ගෙන් ලද පොළී ආදායම රුපියල් දශ ලක්ෂ 28 ක් විය.

**පසු විපරම් කිරීම සහ ව්‍යාපෘති පරීක්ෂණ**

අවශ්‍ය අවස්ථාවන්හිදි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගැනීමේ අරමුණ පෙරදැරි කොටගෙන මෙන්ම ස. ණ. ආයතන විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් සමතයට පත් කිරීම සඳහා ද සුමක ක්‍රමය යටතේ මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘතීන් පසු විපරම් කිරීම සහ පරීක්ෂා කිරීමේ කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. 1990 වසර තුළදී කොළඹ, ගම්පහ, පුත්තලම, රත්නපුර, බදුල්ල සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි පිහිටි ව්‍යාපෘතීන් 168 ක් පරීක්ෂණයට භාජනය කරන ලදී.

**බස්රථ මිලදී ගැනීම සඳහා ණය සහතික ක්‍රමය**

පෞද්ගලික බස්රථ ධාවකයන්ට බස්රථ මිලදී ගැනීම සඳහා සහභාගිත්ව ණය දෙන ආයතන (ස. ණ. ආ.) විසින් දෙනු ලබන ණය වෙනුවෙන් වූ ණය සහතික ක්‍රමයක් ඇති කිරීම මුදල් මණ්ඩලය විසින් 1990.11.22 දින අනුමත කරන ලදී. බස් රථයේ වටිනාකමින් සියයට 75 දක්වා ප්‍රමාණයක් වූ ණය මුදල් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ජාතික සංවර්ධන බැංකුව විසින් ලෝක බැංකුවේ ප්‍රතිව්‍යුහගත ණය ක්‍රමය යටතේ ලංකා රජයට දෙන ණය මුදලින් සපයනු ලැබේ. පහත සඳහන් කරුණු හැරුණුවිට මෙම ක්‍රමයේ කොන්දේසි සුමක ණය සහතික ක්‍රමයට සමාන වේ.

## සු. ම. ක. II සහ III ණය සහතික ක්‍රම

| කර්මාන්ත / යෝජනා ක්‍රම | සු. ම. ක. – II සහ III 1982 – 1990 | | | | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රදානය කළ ණය | | ණය මුදල් | | සහතික කළ මුදල් | |
| | සංඛ්‍යාව | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| 1. ආහාර වර්ග සැකසීම .. | 1,329 | 27·3 | 774,351 | 27·9 | 437,021 | 26·2 |
| 2. වෙනත් කෘෂි කර්මාන්ත .. | 120 | 2·5 | 56,362 | 2·0 | 36,092 | 2·1 |
| 3. රබර් නිෂ්පාදන .. | 135 | 2·8 | 121,492 | 4·4 | 68,899 | 4·1 |
| 4. ලෝහ නිෂ්පාදන .. | 454 | 9·3 | 213,202 | 7·7 | 128,315 | 7·7 |
| 5. ඉදිකිරීම් ද්‍රව්‍ය .. | 410 | 8·4 | 209,130 | 7·5 | 142,090 | 8·5 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු .. | 59 | 1·2 | 46,110 | 1·7 | 26,988 | 1·6 |
| 7. දැව කර්මාන්ත .. | 340 | 7·0 | 128,931 | 4·6 | 85,201 | 5·1 |
| 8. ඇඟලුම් .. | 349 | 7·2 | 252,703 | 9·1 | 158,180 | 9·5 |
| 9. රෙදිපිළි .. | 109 | 2·2 | 91,103 | 3·3 | 51,205 | 3·1 |
| 10. අළුත්වැඩියා කිරීමේ වැඩපලවල් .. | 189 | 3·9 | 76,574 | 2·7 | 49,899 | 3·0 |
| 11. විවිධ .. | 1,377 | 28·2 | 805,815 | 29·1 | 485,618 | 29·1 |
| එකතුව .. | 4,871 | 100·0 | 2,775,773 | 100·0 | 1,669,508 | 100·0 |

5. ශ්‍රී ලංකාවේ මුදල් ඉල්ලුමෙහි පවතින දෝෂ නිරවද්‍ය කිරීම පිළිබඳ ප්‍රවේශයක්.

6. ශ්‍රී ලංකාවේ පුද්ගල ආදායම් බදු පැහැර හැරීම පිළිබඳ තක්සේරු කිරීමක්.

7. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භෝග අංශයන්හි පොහොර භාවිතයෙහි පිරිමැසුම.

8. කෙටිකාලීන සහල් මිළ පිළිබඳ පුරෝකථන ආකෘති.

9. ජාත්‍යන්තර ප්‍රාග්ධන සංචලනය-ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයක්.

10. විනිමය අනුපාත විචලනය සහ උද්ධමනය කෙරෙහි එහි බලපෑම.

11. පරිගණක සම්බන්ධ කටයුතු තුළින් සේවා නියුක්තිය උත්පාදනය කිරීමේ හැකියාව.

12. විදේශීය ණය සහ වෙළෙඳ අනුපාත විචලනයෙන් ශ්‍රී ලංකාවට ඇති කෙරෙන බලපෑම.

13. නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම.

14. කොළඹ පරිවහන පද්ධතියේ ඇති අවහිරතා.

15. සංවර්ධනය වන ආර්ථිකයක නිෂ්පාදනය සහ මිළ තීරණය කිරීම පිළිබඳ මූල්‍යවාදී ආකෘතියක්– ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයක්.

16. සේවා වියුක්තියේ ස්වරූපය සහ ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය පිළිබඳ සංකල්පය.

17. ශ්‍රී ලංකාවෙහි මූර්ත ජාතික ආදායම කෙරෙහි වෙළෙඳ අනුපාතයේ ඇති බලපෑම.

18. මූල්‍ය ප්‍රතිපත්තිය කාලානුරූප කිරීම—ශ්‍රී ලංකාව ආශ්‍රිතව

## ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශනාගාරය

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ අංශයක් ලෙස පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශනාගාරයේ කටයුතු 1990 වර්ෂය තුළදී ද තවදුරටත් ක්‍රියාත්මක විය. නිෂ්කාශන කටයුතු වඩා වේගවත්ව කිරීමට හැකිවීම වර්ෂය තුළදී මෙ මගින් ඇති වූ මූලික සංවර්ධනයක් විය. නිෂ්කාශනාගාරය වෙත සෑම දිනකම ප. ව. 5 දක්වා ලැබෙන සියළුම චෙක්පත් එහිදී පිළියෙල කර වාණිජ බැංකුවලට පිට පළාත්වලට යැවිය හැකිවන ලෙස එදිනම ප. ව. 10 ට ආපසු යවනු ලැබේ. සමහර බැංකු ශාඛා ඔවුන්ගේ චෙක්පත් එදිනම රාත්‍රියේ ලබාගත් අතර, අනිකුත් බැංකු ශාඛාවලට පසු දින පෙ. ව. 6 ට ලබාගත හැකි විය. එක් දින නිෂ්කාශන කටයුතු සම්බන්ධ කාලසටහනෙහි වූ මුළු බැංකු/ශාඛා සංඛ්‍යාව 193 බවට පත්කරමින්, තවත් බැංකු ශාඛා 48 ක් එක් දින නිෂ්කාශන කාලසටහනට ඇතුළත් විය.

ගාලු දිස්ත්‍රික්කය දින 3 නිෂ්කාශන කාලසටහනට ඇතුලත්ව ඇති අතර, උතුරු හා නැගෙනහිර පළාත් ශාඛා හැර අනිකුත් සියළුම පිට පළාත්වල ශාඛා දින 5 නිෂ්කාශන කාලසටහනට ඇතුළත්ව තිබේ. ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශනාගාරය මගින් නිෂ්කාශනය කරනු ලැබූ මුළු චෙක්පත් සහ බැංකු අණකර සංඛ්‍යාව 1989 දශ ලක්ෂ 12 (රුපියල් බිලියන 367) සිට 1990 දී දශ ලක්ෂ 14 (රුපියල් බිලියන 528) දක්වා වැඩි වී ඇත.

## කළමනාකාරිත්ව විගණන

මහ බැංකුවේ කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව 1990 වර්ෂය තුළදී ලේකම්, පරිශ්‍ර, සුභසාධන, බැංකු කටයුතු, ව්‍යවහාර මුදල්, ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය, කළුතර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව සහ එහි ශාඛාවල විගණන කටයුතුවල නිරත විය. විගණන කටයුතුවලදී බැංකුවේ නීති හා රෙගුලාසි අනුව කටයුතු කර නොමැති අවස්ථා පෙන්වා දීමට උත්සාහ කර ඇත.

මහ බැංකුවේ පිහිටුවා ඇති මිනිස්බල සැලසුම් ඒකකය මගින් මහ බැංකුවේ මිනිස්බල සැලසුම් සම්බන්ධ සමහර අංශ පිළිබඳ වාර්තා සකස් කරන ලදී.

## සමීක්ෂණ සහ දත්ත රැස්කිරීම

### ජාතික ගිණුම්

1990 වර්ෂයේදී ජාතික ගිණුම් ඇස්තමේන්තුවල ගුණත්වය තවදුරටත් වර්ධනය කිරීම සඳහා මහ බැංකුව විසින් පියවර ගෙන ඇත. මෙම අරමුණ මත, ද. දේ. නි./ද. ජා. නි. ආංශික වශයෙන් ගණනය කිරීම සඳහා උත්සාහ ගන්නා ලදී. ගෘහස්ථ අංශය සහ රාජ්‍ය හා විදේශීය අංශවල 1988 සහ 1989 සඳහා වූ ඇස්තමේන්තු 1990 දී ආංශික පදනම මත සකස් කරන ලදී. ජාතික ගිණුම් ඇස්තමේන්තු සඳහා ද්විතීයික මූලයන්ගෙන් දත්ත එකතු කිරීමට වඩා ප්‍රාථමික මූලයන්ගෙන් දත්ත එකතු කිරීමට පියවර ගනු ලැබීය. ජාතික ගිණුම් ඇස්තමේන්තුවල දත්ත පදනම වර්ධනය කිරීමේ අදහස ඇතිව හැකි අවස්ථාවලදී කාර්තු පදනම මත දත්ත රැස්කරන ලදී.

### දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ක්‍රමය

1978 සිට ක්‍රියාත්මක කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය යටතේ දත්ත රැස් කිරීම, 1990 දී තවදුරටත් කරගෙන යනු ලැබිණි. මෙම වැඩපිළිවෙල යටතේ, පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිළ, ද්‍රව්‍යයන් බොහෝ ගණනක නිෂ්පාදන මිළ, කෘෂිකාර්මික සහ අසංවිධිත අංශයේ සුළු පරිමාණ තැනීම් කටයුතු කීපයක දිනපතා වැටුප් මට්ටම් වැනි තොරතුරු විධිමත් ක්‍රමයක් යටතේ දිවයින පුරා පිහිටි තෝරාගත් මධ්‍යස්ථාන වලින් රැස් කරනු ලැබිණි.

### පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණය - 1986/87

" පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණය—1986/87 " වාර්තාවේ දෙවන කොටසෙහි මුද්‍රණ කටයුතු 1990 වර්ෂය අග වනවිට අවසාන පියවරෙහි පැවතිණි. 1991 වර්ෂය මුලදී මෙම වාර්තාව නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. වාර්තාවේ පළමු කොටසෙහි කටයුතු 1990 දී අවසන් කරන ලදී.

### ආදායම් වර්ධන කාර්යයන් සහ ප්‍රජා ණය නියාමක යෝජනා ක්‍රමය පිළිබඳ සමීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෙම සමීක්ෂණය 1990 ඔක්තෝබර් 3 දින සිට 1990 ඔක්තෝබර් 22 දින දක්වා මාතලේ, මහනුවර, නුවරඑළිය සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල පවත්වන ලදී. ප්‍රජා ණය නියාමක යෝජනා ක්‍රමය පිළිබඳ අතුරු වාර්තාවක් 1990 දී සකස් කොට ඉදිරිපත් කරන ලදී.

### ආනයන මූල්‍යකරණය

ණයවර ලිපි හා ණයවර ලිපි සඳහා ලැබී ඇති බිල්පත්‍ර ඇසුරින් එකතු කරන ලද දත්ත උපයෝගී කරගෙන දෙපාර්තමේන්තුව මගින් ආනයන මූල්‍යකරණ කටයුතු තවදුරටත් කරගෙන යන ලදී. මෙම දත්ත පරිහරණය කරන්නන්ට කාලානුරූපව දත්ත සැපයීමට හැකිවන අයුරින් 1990 දී මෙම වැඩපිළිවෙල දියුණු කරලීය.

## පුහුණු කිරීම්

මහ බැංකුව විසින් සිය නිලධාරීන් අධ්‍යාපනික හා අධ්‍යාපනික නොවන ක්ෂේත්‍රයන්හී මෙන්ම ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවලද පුහුණු කිරීම් කටයුතු 1990 වර්ෂය තුළදී ද තවදුරටත් කරගෙන යන ලදී. අධ්‍යාපනික පුහුණුව මූලික වශයෙන්ම පිළියෙල කරනු ලැබුවේ විදේශයන්හි පිළිගත් විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යාව හා අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහාය. ශ්‍රී ලංකාව තුළ ඩිප්ලෝමා පාඨමාලාද මෙයට ඇතුළත් වේ. 1990 වර්ෂයේදී නිලධාරීන් දෙදෙනෙකු ශාස්ත්‍රපති උපාධිය සඳහා එතෙර යවනු ලැබීය. වර්ෂය තුළදී නිලධාරීන් 11 දෙනෙකු විදේශයන්හි ශාස්ත්‍රපති උපාධි පාඨමාලා හැදෑරූ අතර 4 දෙනෙකු ආචාර්ය උපාධිය හදරනු ලැබීය. විමර්ශණයට ලක්වන වර්ෂය තුළදී, නිලධාරීන් 4 දෙනෙකු ශාස්ත්‍රපති උපාධිය අවසන් කර ආපසු පැමිණි අතර එක් නිලධාරියකු ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු පැමිණ ඇත.

අධ්‍යාපනික නොවන අංශයන්හි පුහුණු කිරීම් වූ දිගුකාලීන හා කෙටිකාලීන පුහුණුවීම් පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩ මුළු, අධ්‍යාපනික සංචාර සහ ඒ ඒ ස්ථානවලට ගොස් දැකබලා ගැනීම් ආදී මහ බැංකුවට ප්‍රයෝජනවත් ක්ෂේත්‍රයන්හි විදේශීය ආයතනවල පුහුණුවීම් ලබාදීමට කටයුතු යොදන ලදී. නිලධාරීන් දෙදෙනෙකු සංඛ්‍යාන ක්ෂේත්‍රයේ දිගුකාලීන පුහුණු පාඨමාලා හදරනු ලැබීය. සමස්තයක් ලෙස 1990 වර්ෂය තුළදී කෙටිකාලීන පුහුණුවීම් සඳහා නිලධාරීන් 70 දෙනෙක් එතෙර යවනු ලැබීය. කෙටිකාලීන පුහුණුවීම් සඳහා එතෙර යවනු ලැබූ නිලධාරීන්ට අමතරව, නිලධාරීන් 193 දෙනෙක් ශ්‍රී ලංකාවේ විවිධ ආයතන මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා සඳහා සහභාගි වූ අතර නිලධාරීන් 93 දෙනෙක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පාඨමාලා සඳහා සහභාගි විය.

කොළඹ විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවනු ලැබ 1989 වර්ෂයේ අවසන් කාලයේදී ආරම්භ කරන ලද '' විදේශ අධ්‍යයන සඳහා ඉංග්‍රීසි '' පාඨමාලාව 1990 වර්ෂයේදී ද තවදුරටත් පවත්වා ගෙන යමින් මුල් පාඨමාලාවට සහභාගි වූ නිලධාරීන්ගෙන් ඉහළ ඇගැයීමක් පෙන්වූ නිලධාරීන් සඳහා පසු විපරම් පාඨමාලාවක් ද පවත්වන ලදී. මෙම පාඨමාලාවට සහභාගි වූ මුළු නිලධාරීන් සංඛ්‍යාව 28 කි.

පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා විදේශවලට යැවීමට බලාපොරොත්තුවන නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් ද සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණ, පශ්චාත් උපාධි ශිෂ්‍යයනට ප්‍රයෝජනවත් යයි සැළකිය හැකි මාතෘකා යටතේ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පවත්වන ලදී.

# කාර්ය මණ්ඩල පුවත්

අධිපති, ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක මහතා 1990 වර්ෂය තුළ දී පහත සඳහන් සම්මේලන සහ රැස්වීම්වලට සහභාගි විය.

1. ඇමෙරිකා එක්සත් ජනපදයේ දී පවත්වන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ අධිපති මණ්ඩල අන්තර් කමිටු රැස්වීම.
2. ටෙහෙරාන් නුවර පවත්වන ලද ආසියානු නිෂ්කාශණ සංගමයේ 18 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීම.
3. ලන්ඩන් නුවර පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල මහ බැංකු අධිපතිවරුන්ගේ වාර්ෂික රැස්වීම.
4. ඇමෙරිකා එක්සත් ජනපදයේ දී පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය මුදල් ඇමතිවරුන්ගේ රැස්වීම සහ ජා. මූ. අ./ලෝක බැංකු වාර්ෂික රැස්වීම.
5. මලයාසියාවේ 'සියසන්' මධ්‍යස්ථානය වෙත කළ සංචාරය සහ කුවාලාලම්පූර් සහ ඩැකා නුවරවලදී පවත්වන ලද ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ දකුණු ආසියානු කලාපීය සම්මේලනයන්.
6. ඉන්දියාවේ පවත්වන ලද 'සියැන්සා' මහ බැංකු අධිපතිවරුන්ගේ රැස්වීම සහ සාකච්ඡා සමුළුව.

නියෝජ්‍ය අධිපති ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කරන ලදුව, අධිපති ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි අවස්ථාවන්හිදී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් සහ මුදල් මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කරන ලදී.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් එච්. බී. දිසානායක මහතා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් නොමැති අවස්ථාවන්හිදී, මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් මුදල් මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි විය.

## පත්වීම්

නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ කේ. ජී. ධර්මසේන මහතා 1990 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක සංවර්ධන මුදල් අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී. 1990 ඔක්තෝබර් 8 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු වැඩ බලන ආයතන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී කේ. සී. එම්. ගුණසේකර මහතා 1990 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවක අර්ථ සාධක අරමුදලේ වැඩබලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

නියෝජ්‍ය විනිමය පාලක ඩී. එල්. ජයමාන්න මහතා 1990 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක විනිමය පාලක වශයෙන් පත් කරන ලදී.

**මුදහරිනු ලැබ සිටි නිලධාරීන් (1990 දෙසැම්බර් 31 දිනට)**

පහත නම් සඳහන් නිලධාරීහු, අමාත්‍යාංශවල, රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථාවල සහ ජාත්‍යන්තර ආයතනයන්හි තනතුරු සඳහා මුදහරිනු ලැබ සිටියහ.

ඒ. එස්. ජයවර්ධන මහතා ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එන්. ඊ. එච්. සඳරත්න මුදල් අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු බංග්ලා දේශය, භූතානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

පී. එම්. නාගහවත්ත මහතා, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සහ සැලසුම් අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම සඳහා නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත.

කේ. බී. දොඩන්ගොල්ලාගම මහතා, තුනීලැලි සංස්ථාවේ සභාපති වශයෙන් කටයුතු කිරීම සඳහා, කර්මාන්ත, විද්‍යා සහ තාක්ෂණ කටයුතු අමාත්‍යාංශය වෙත.

ඩී. එස්. අයි. ඒ. ආරියදස මහතා, සී. ලියනගේ මහතා, ඩබ්ලිව්. ඒ. ඩී. ඊ. වීරසිංහ මහතා, එන්. එම්. දයාරත්න මහතා සහ කේ. සරවනමුත්තු මෙනෙවිය, මුදල් අමාත්‍යාංශය වෙත.

එස්. එම්. ඒ. සිරිවර්ධන මහතා, දිස්ත්‍රික් ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී ලෙස කටයුතු කිරීම සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයෙහි සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වූ ණය ව්‍යාපෘතිය වෙත.

ඩබ්ලිව්. ඒ. විජේවර්ධන මහතා, එන්. එම්. ජයසේකර මහතා සහ ඒ. එල්. ප්‍රේමචන්ද්‍ර මහත්මිය ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත.

**විශ්‍රාම ගැනීම්/ඉල්ලා අස්වීම්**

නියෝජ්‍ය අධිපති ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක, 1990 ජනවාරි 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

විධායක අධ්‍යක්ෂ යූ. ඒ. ද සිල්වා මහතා 1990 අප්‍රේල් 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

විධායක අධ්‍යක්ෂ ඩී. කේ. ජයවර්ධන මහතා 1990 නොවැම්බර් 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

ව්‍යවහාර මුදල් අධිකාරී ජී. ඩී. බී. මුනිදස මහතා 1990 පෙබරවාරි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී ඊ. ඩබලිව්. ඊ. විජේතුංග මහතා 1990 පෙබරවාරි 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

මාණ්ඩලික පන්තියේ 4 ශ්‍රේණියේ ආචාර්ය ජී. එම්. අබේරත්න 1990 සැප්තැම්බර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු සේවාවෙන් ඉල්ලා අස්විය.